**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.11.11 |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ටී.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
20. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
21. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
22. පී.ජී.මල්ලිකා මැතිතුමිය
23. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
26. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
27. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
28. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
29. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
30. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
31. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
32. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
33. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
34. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
35. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2025.10.08 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.10.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.10.08 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ශබ්ද විකාශන පද්ධතිය පවතින දෝෂ සහිත බව නිසා සභා වාර්තාවේ අඩුපාඩු පැවතුන හොත් ඒ සම්බන්ධව සමාව භජනය කරන බව ප්‍රකාශ කරන ලදී.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සභාපතිතුමනි,උප සභාපතිතුමනි,මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් හා මාධ්‍යවේදී මහත්මයන්ලාගෙන් අවසරයි.පසුගිය සභා වාරයේදී සමීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඇවිදින මන්තීරුව සම්බන්ධ යෝජනාව මං ප්‍රකාශ කළ අදහස් පැහැදිලි නොමැති බව දන්වා තිබේ. මම එහිදී ප්‍රකාශ කළේ ඇවිදින මං තීරුව තිබෙන ස්ථානයේ ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් සාද පැවැත්වීමට යොමු කරන ලෙස ප්‍රකාශ කළා. මම එහිදී ප්‍රකාශ කලේ ඇවිදින මන්තීරු නිර්මාණය කළේ මහජනතාවගේ ශරීර සුවතාවය සඳහන් බවත්, එවැනි දේකට ඒ නිරාවරණය කළ විට සභාවට ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදුවන බවත්,එය පිරිසිදු කළේ ජනතාවට භාවිතා කිරීම සුදුසු තත්ත්වයට ගෙන ගෙන එන බවත්, ප්‍රකාශ කරන ලදී. එම යෝජනාව වාර්තාවේ සඳහන් වෙනවා ඒකමතිකව සම්මත වූ බවට නමුත් තීන්දුවකට ආවේ නැත.

පිටු අංක 57 හි සඳහන් යටිවල්දෙණිය මාර්ගය හා කඩිගමුව මාර්ගයේ සංවර්ධනය කිරීම සම්බන්ධ යෝජනවට අදහස් ප්‍රකාශ කරන ලදි.එහිදී යටිවල්දෙණිය මාර්ගය පිළිබඳව ඇස්තමේන්තු සකස් කර පළාත් සභාවට ඉදිරිපත් කර ඇති බවත් වාර්තාවට අනුව දුම්රිය පොළ පාර ලෙස සටහන් වී ඇති නමුත් එය යටිවල්දෙණිය මාර්ගය ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

පිටු අංක 43 හි මගේ නමින් ප්‍රකාශයක් සටහන් වී බවත්, මා එවැනි ප්‍රකාශයක් සිදු නොකළ අතර එහි නම සංශෝධනය කර නිවැරදි කරන ලෙස සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය**

පිටු අංක 42 හි පස්වන ඡේදය සංශෝධනය විය යුතු බවත්,එහි ණය අතහැර දමලා තිබෙන බවට සඳහන් වී බවත්,එහිදී මා සඳහන් කළේ ස්වයං රැකියා වශයෙන් පවත්වා ගෙන ගිය ව්‍යාපෘති නවතා තිබෙන බව ප්‍රකාශ කළ බවය එම නිසා එය එසේ නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ශබ්ද විකාශන පද්ධතියට අදාළ බිල ගෙවා නොමැති බවත්, මෙම පද්ධතියේ තවම පරීක්ෂණ මට්ටමේ පවතින බවත්, අඩුපාඩු පවති නම් සාධනීය ලෙස කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.2025.10.08 දින පැවති මාසික මහ සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම වාර්තාව සංශෝධනයන්ට යටත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.ඒ අනුව 2025.10.08 දින පැවති මාසික මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන.**

01. පසුගිය සතියෙහි සාහිත්‍ය කලා උළෙල පැවැත් විය. එහිදී කොට්ඨාශයේ පාසල් පාදක කර ගනිමින් ඔවුන්ගේ සාහිත්‍යය දක්ෂතා ඇගයිමකට ලක්කර ත්‍යාග පිරිනැමීමක් සිදු කළ බව ප්‍රකාශ කරන ලදි.

02.රඹුක්කන අශෝක ක්‍රීඩාංගනය පින්තාරු කිරීම.

මේ වන විට ඒ අවසන් අදියරයේ පවතින බවත් ඒ සඳහා ධන පරිත්‍යාගයක් සිදුකළ සුගත් සිසිර මහතාට ස්තූති ප්‍රකාශ කරන අතර ඔහුගේ වෙළඳ ප්‍රචාරන දැන්වීම් පුවරුවක් ස්ථාපනය කිරිම සුදුසු බවත්, එම ක්‍රීඩාංගනය පරිහරණය කිරීමේදී ඒ ආරක්ෂා කිරීම අපේ වගකීම බවත් ප්‍රකාශ කරන ලදී.

**(ඇ). සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

1. අසනිප බැවින් 2025.11.11 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව 2025.11.11 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමාට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

2. අසනිප බැවින් 2025.11.11 දින පැවැත්වෙන මහ සභාවට සහභාගි විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලදි.ඒ අනුව 2025.11.11 දින පැවැත්වෙන මහ සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමියට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබාදිම ගරු මහ සභාව විසින් අනුමත කරන ලදි.

(ඇ). සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ඉහළ ඇත්වටේවත්ත ජනතාව විසින් ඉදිරිපත් කරන ලද සංදේශයක් සභාවට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටියහ.එහි සඳහන් පරිදි කිරිවල්ලාපිටිය විජයමන්නාහේන ආදාහනාගාරයේ මෘත දේහයන් ආදාහනය කිරීමේදී පිටවෙන දුම් සුළඟ පවතින අවස්ථාවලදී අවට පරිසරයට මුසු වන බැවින් ඉහළ ප්‍රදේශයේ නිවාස වලට හා අවට පරිසරයට ගැටලූ ඇතිවන බැවින් විමිනිය සඳහා තව කොටසක් සවි කොට හා ඊට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ප්‍රදේශවාසින් විසින් ලබාදුන් ලිපිය මහ සභාව වෙත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

2002 වසරේ අප සභාව නියෝජනය කළ මොලගොඩ කොට්ඨාශයේ මංගලගම පදිංචි ඉංජිනේරු නිහාල් ජයරත්න මැතිතුමාගේ හදිසි අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටියහ. 2002 වසරේ සිට 2006 වසර දක්වා කාලපරිච්ඡේදයේ අප සභාවේ සභිකයකු ලෙස තේරී පත්ව සිටි මෙතුමා හදිසි රෝගාබාධයක් හේතුවෙන් සිදු වූ අකල් මරණයක් බවත්, එතුමාගේ හදිසි වියෝව අප සැමගේම හද කම්පනයට පත්වන බවත්, අප සැමගේ ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත්, සඳහන් කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

එස්.ගයාන් මහතාගේ බිරිඳ අසනීප තත්ත්වයෙන් පසුවන නිසා වෛද්‍යාධාර ලබා ගැනීමට ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01.ප්‍රාදේශීය සභා සභිකයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳව විමසීමේ ලිපියට අදාළ පිළිතුරු ලිපිය ලැබී තිබෙන බවත්,ඒ අනුව වර්තමාන රීති සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව ධූරධාරීන් ලෙස ඉදිරිපත් වන සභිකයින්ගේ ජ්‍යෙෂ්ඨත්වය ඔවුන් සහභාගී වන අනුපිළිවෙල අනුව තීරණය කළ යුතු බවත් සඳහන් කර ඇත බව ප්‍රකාශ කරමින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදි.

02.සේරුමැඩිල්ල මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදි.එහි සඳහන් පරිදි කඩිගමුව ග්‍රාම නිලධාරී වසමේ. සේරමැඩිල්ල මාර්ගයේ ගමන් කිරීමට අපහසු ස්ථාන දෙකක් ඇති බවත්, එම ස්ථාන දෙක කොන්ක්‍රීට් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ගම්වාසින් විසින් ඉල්ලීම් කරන ලදි ලිපිය සභාවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.එම සංවර්ධන කටයුත්ත පිළිබඳ අවධානය යොමු කරන බවත්,සඳහන් කරන ලදි.

(ඉ). යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න
යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න නොමැති බවට ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදි.

(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා
**(ඊ)1.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ කෙටුම්පත අනුමත කර ගැනීම සඳහා මහ සභාව වෙත ඉදිරිපත් කිරිම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන්ද/තුමියන්ලාගෙන්ද අවසරයි. අද දවස අපිට විශේෂත්වයක් බවත්, ඒ තමයි 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛන කෙටුම් පත අනුමත කර ගැනීමේ යෝජනාව ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.එය අනුමත කරදෙන ලෙස යෝජනා කරන බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමා**
සභාපතිතුමනි,සියලු මන්ත්‍රීවරුණි,අද ඔබතුමාගෙන් ඉදිරිපත් වූ අයවැය කියවා අවසන් කිරීමට නොහැකි බැවින් ඒ සඳහා වෙන දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙතුමා කළ යෝජනාව මම ප්‍රශ්නයක් නැති බවත්, ගරු මන්ත්‍රීතුමන්ලාගේ කැමැත්තට මම ඉඩ බව ප්‍රකාශ කරන ලදි. එය එහෙමනම් අපි එහෙම කරමු. යනුයෙන් ප්‍රකාශ කළ අතර මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වන්න මේක වෙන දවසකට ගන්නවාද ? අද දින සාකච්ඡාවට ගන්නවාද යන්න ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද මාධ්‍යය හිතවතුන්ගෙන් ද අවසරයි. තෙන්නකෝන් මැතිතුමාගේ යෝජනාවට මම විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්,මම යෝජනා කරන්නේ මේ අයවැය අද දින සම්මත කරගත යුතුයි බව ප්‍රකාශ කරන ලදි. මෙය කියවීමට දවස් දෙක කාලයක් සෑම මන්ත්‍රීවරයෙකුට තිබුණ බවත්, ඒ නිසා මේක අපි නොවැම්බර් මාසයේ කර ගැනිමට අවශ්‍ය බැවින් මෙය ස්ථිර කරන්න කියන අදහස මම ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අයවැය අනුමත කිරිමට ඉදිරිපත් කර තිබුණත්,මෙය විශේෂ මහ සභාවකින් සාකච්ඡා කර ගෙන සම්මත කර ගනිමු. යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ පී පද්මසිරි මැතිතුමා**
සභාවට අයවැය කෙටුම්පත ඉදිරිපත් කරන බවට දැනුම් දීමක් කර තිබුණ බවත්, මේ ගැන යෝජනා අදහස් ලබා දිමට දැනුවත් කළ බවත්, අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කරන්න නැවත දිනයක් දැමීම මෙහි සඳහන් නොමැත බවත්,අද මේ සභාවට ඉදිරිපත් කර ඇති අයවැය කෙටුම්පත සෑම මන්ත්‍රීවරයකුටම දින හතරකට පෙර යවලා තිබෙන බව ප්‍රකාශ කරන ලදි. මේකට සූදානම් වෙලා අදහස් යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, සභාපතිතුමා විසින් කළ යෝජනාවට එකඟ වෙලා අනුමත කරගැනීමට වැඩ කටයුතු සිදු කර ගනිමු කියලා යෝජනා කරන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමා**
මම යෝජනාවට විරුද්ධයි. මහ සභාවට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරිම සුදුසු නැති බවත්,ඒ සඳහා විශේෂ දිනයක් අවශ්‍ය බවත්,ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අයවැය කෙටුම්පතක් යනු අපි විසින් ආදායම් උපයා ගන්නා ආකාරයත්,එම ආදායම් වියදම් කරන්නේ කෙසේද යන්නත් පිළිබඳව සකස් කරන ලද වාර්තාවයි.වාර්ෂික වාර්තාවක් මානසික මහා සභාවට ඉදිරිපත් කිරීම ගැටලු සහගත නොවන බවත් ඉදිරි දිනයකට ගෙන ගියහොත් මුදල් හා කාලය අපතේ යන බැවින් මෙම සභා වාරයේදීම සාකච්ඡාවට භාජනය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. තවද සභාවක් පවත්වාගෙන යාමේදී අපට ආදායම් උත්පාදන මාර්ග ලෙස පරිපනම් බදු කඩකුලි වෙනත් බදු ආදායම් හා සභා දේපළ මත හිමිවන ආදායම් දැක්විය හැකි බවත්, පෙර වසර වලට සාපේක්ෂව ඉදිරි වසරේදී ආදායම් ඉපයීමට වඩා සාර්ථක මට්ටමකට යාම අපේක්ෂා කරන බවත් දන්වා සිටින ලදී.මෙවර පුනරාවර්තන ආදායම රුපියල් මිලියන 224 ක් පමණ අපේක්ෂා කරන අතර පින්වල අලි අනාථාගාරය ඉදිරිපස රථ වාහන අංගනයෙන් ආදායම් උත්පාදනය ඉහළ නැංවීමට වීමට අපේක්ෂා කරන බවත්,රඹුක්න බස් නැවතුම් ඉදිකළ වර්ෂයේ සිට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට නොමිලේ පවරාදී තිබෙන බවත්,2026 වර්ෂයේ සිට එමඟින් ආදායමක් උත්පාදනය කර ගැනීමට අදහස් කර ඇති බවත් දන්වා සිටින ලදී.පසුගිය කාලවකවානුවලදී සභාව සතු දේපළ සභාව අතහැර දමා තිබූ බවක් පෙනී යන බවත් අප විසින් එම දේපළ සභාව සතු කරගෙන සභාවේ ආදායම ඉහළ නැංවා ගැනීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම පුනරාවර්තන වියදම ලෙස රුපියල් මිලියන 206 ක් පමණ වේ යැයි අපේක්ෂා කරන අතර අතිරික්තයක් ලෙස රුපියල් මිලියන දහ අටක් පමණ ඉතිරි කර ගැනීමට හැකිවන බවත්,එම අතිරික්ත මුදලින් රඹුක්කන කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී. සංවර්ධන සැලසුම් අතර ආයුර්වේදය,පෙරපාසල,ළමා උද්‍යානය, පුස්තකාලය සහ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, ඉඩම් වැඩිදියුණු කිරීම,පොදු වෙළඳපළ නවීකරණය කිරීම,ශ්‍රවණාගාර සංකීර්ණය ඉදි කිරීම, ඒ වගේම රුපියල් මිලියන සීයක ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්,ප්‍රකාශ කරන ලදී.

තවද ශ්‍රවණාගාර සංකීර්ණ ඉදිකිරීම මේ වන විට සිදුවෙමින් පවතින බවත්,ඉදිරි වසරේදී තැන්පතු මුදලින් මිලියන 150 ක මුදලක් නිදහස් කිරීමට සිදුවන බවත්, 2026 වර්ෂය අවසාන වීමට ප්‍රථම එය විවෘත කිරීමට හැකි වුවහොත් ආදායම් තත්ත්වය ඉහළ නැංවෙන බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම විශේෂයෙන් හොරකම,වංචාව නැති කර අල්ලස දූෂණයෙන් තොර සමාජයක් උදෙසා මෙම අයවැය ඉදිරිපත් කරනු ලබන්නේ යැයි ප්‍රකාශ කළ අතර ඇයවැය කෙටුම්පත සම්බන්ධව ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරන මෙන් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

විපක්ෂය නියෝජනය කර තෙන්නකෝන් මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි මෙම අයවැය කෙටුම්පත මාසික මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු නොවන බවත්, අයවැය යෝජනා සාකච්ඡාවට භාජනය කිරීමට කාලය ප්‍රමාණවත් නොමැති බවත්,මේ සඳහා විශේෂ සභාවක් කැඳවන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අයවැය යෝජනාව අනුමත කර ගැනීමට වෙන විශේෂ මහ සභාවක් කැඳවන ලෙසත්, මාසික මහා සභාවේදී මේ සම්බන්ධව කතා කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමා**

අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා විශේෂ මහ සභාවක් කැඳවන ලෙසත්, එසේ ලබා නොදෙන්නේ නම් විපක්ෂය මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් ඉවත්ව යන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

විපක්ෂය විසින් ඉදිරිපත් කර කළ යෝජනාද මෙම කෙටුම්පතෙහි ඇති අතර කෙටුම්පත ලැබී දින හතරක් තුළ ඔබතුමන්ලා විසින් අධීක්ෂණය කළ ප්‍රමාණයක් ඇත්නම් ඒ ප්‍රමාණයවත් මේ සභා වාරයේදී සාකච්ඡාවට භාජනය කරන්න පුළුවන් අතර සාකච්ඡා කිරීමට නොහැකි ප්‍රමාණය වෙනත් දිනයකට යා යුතු බවට හැඟුණු පවසන ලදි. අද දින ඒ පිළිබඳව සාකච්ඡා කරමු.මේ වෙනුවෙන් වෙන් කළ කාලය හා මුදල් පිළිබඳව සිතා සහයෝගය ලබාදෙන මෙන් ප්‍රකාශ කරන ලදී.

අයවැයට ඉදිරිපත් කිරීමට විරෝධතාවය

විපක්ෂය මන්ත්‍රීවරුන් හා හා උප සභාපති ඇතුළු පක්ෂ මණ්ඩලය අතර විරෝධතාවයක් මතුවූ අතර සභාපතිතුමා විසින් එය සමථයකට පත් කරන ලදී.

- **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

අයවැයේ කෙටුම්පත පැයකට හෝ දෙකකටවත් විවාදයට ගැනීමට සහයෝගය දෙන ලෙසත් එවිට ඒ වෙනස් දිනයකට ගෙන යා යුතු නැද්ද යන්න සාධනීය නම් වෙනත් දිනයකට යාමට යෝජනා කරනු යැයි ප්‍රකාශ කරන ලදි.

සභා ගර්භයේ ඝෝෂා

සභාපතිතුමා විසින් එය සමථයකට පත් කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

මෙම කෙටුම්පතට ඇතුළත් කරන ලබන කරුණු සම්බන්ධව ඔබතුමාලාව කලින් දැනුවත් කළ අතර මේ සඳහා විශේෂ දිනයක් අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සියලු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.හිතුවක්කාර තීරණ නොගෙන සභාගර්භයේ රැඳී සිටින ලෙසත්,එතුමා විසින් අයවැය විවාද සම්බන්ධව තවම තීරණයක් ගෙන නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

සියලුම මන්ත්‍රීවරුන් මේ යෝජනාව සම්බන්ධව සාකච්ඡා කර එකඟතාවයකට ඒම සුදුසු බවත්,කාලය අපතේ යන බවත්,ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරුණික ඉල්ලා සිටිනවා.

විපක්ෂ මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් පෙරවරු 10.45 ඉවත්ව ගියා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

සභාවේ රැඳී සිටින මන්ත්‍රීවරු මේ යෝජනාව සම්බන්ධව සාකච්ඡා කිරීමට කැමති නම් සාකච්ඡාවට භාජනය කරනවාද? යන්න පිළිබඳව තීරණයක් වෙනත් දිනයක් සඳහා යෝජනා කරනවාද යන්න පිළිබඳ තීරණයක් සභාපතිතුමාට ගන්නා මෙන් යෝජනා කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විපක්ෂ මන්ත්‍රීන් මගේ තීරණය නොඅසාම සභාගර්භයෙන් ඉවත්ව ගිය ද මා ද උපසභාපතිතුමා ඇතුළු පක්ෂ මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 16 ක් හා ස්වාධීන මන්ත්‍රීවරයකු සභාගර්භයේ රැඳී සිටින බැවින් ගණ පූර්ණය සම්පූර්ණ වන බැවින් ද අයවැය කෙටුම්පත සාකච්ඡාවට අද දින යොදා ගන්නා බව ප්‍රකාශ කරන ලදි.ඒ අනුව ඔබතුමන්ලාගේ අදහස් හා යෝජනා වෙතොත් ඉදිරිපත් කරන මෙන් දන්වා සිටියහ.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

රටේ පැවති දේශපාලන සංස්කෘතිය මැනවින් පිළිබිඹු වූ අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකි බව ප්‍රකාශ කළ අතර 2026 කොට්ඨාශයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ග්‍රාමීය මට්ටමේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට විපක්ෂය අපට සහයෝගය ලබා දෙන ඇතැයි අපේක්ෂා කළ බවත්,විපක්ෂය සභාගර්භයෙන් ඉවත් වීමත් සමඟ එම කාර්යයක් කරගෙන යාමේදී ගැටුම් ඇති විය හැකි බවත්,අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රථම මන්ත්‍රීවරුන් හට ඒ පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදී තිබූ බව තවදුරටත් ප්‍රකාශ කර සිටින ලදි. විපක්ෂය සභාගර්භයෙන් ඉවත් වීම සැලකිලිට භාජනය කළයුතු කරුණක් නොවන බවත්,ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන්

පැනවීම සම්බන්ධයෙන් මතුවු කරණ ගැන පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් පැවසු විට එතුමා දන්වා ඇත්තේ නවක මන්ත්‍රීවරයකු ලෙස අසුන් පැනවිම සිදු කළයුතු බවත් ප්‍රකාශ කරන ලදි.එහෙත් අපි එසේ සිදු නොකළ බවත් පවසන ලදි. ජොෂ්ඨ මන්ත්‍රීවරු ඔවුන්ගේ ජොෂ්ඨ පාවිච්චි කර නවක මන්ත්‍රීවරුන්ගේ අකමැත්තෙන් හෝ කැමැත්තේ හෝ පක්ෂය වෙනුවෙන් සභාගර්භයෙක් පිටව ගිය බව සඳහන් කරන ලදි.සභාපතිතුමා ඇතළු මන්ත්‍රීතුමන්ලා 21 දෙනෙක් සිටින බැවින් ප්‍රාදේශීය සභාවේ අදායම වැඩි කිරිමට ගතහැකි සියලු ක්‍රියාමාර්ග ගනු ලබන බව ද ප්‍රකාශ කරන ලදි.තවද නාස්තිය, දූෂණ වළක්වා ඉතිහාසයේ රඹුක්කන ප්‍රාදේශීය සභාවට අහිමි කළ සියලුම දේපල, අදායම 2026/2027 වර්ෂ වලදී ලබා ගැනිමට සැලසුම් සිදු කරමින් යන බව පවසන ලදි.මෙම දූෂණ ඉවත් කර ඉතා සාධාරණ,විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරිමට පොරොන්දු වන බවත්,අපි වගකියන්නේ සුන්බුන් විෂක්ෂයට නොව රඹුක්කන ජනතාවට බවත්,ප්‍රකාශ කරන ලදි.කොට්ඨාශය නියෝජනය නොකලත් ඔවුන්ට ජනවරමක් තිබෙනවා ඒ ජනවරමට ගරු කරලා ගම්වල සංවර්ධන කටයුතු කිරිමට අවශ්‍ය යැයි සිතා හයව මාසයේ සිට එකළොස්වන මාසය දක්වා ඔවුන්ගේ යෝජනා සමහ සභාවාර පත්වාගෙන පැමිණි බව ද ප්‍රකාශ කරන ලදි.මම විශ්වාස කරන්නේ අයවැය පිළිබඳ ආර්ථික දැනුමක් තියොගෙන නොවෙයි.අයවැයට විරුද්ධ වන්නේ දේශපාලන කෝණයකින් බවත්,ඒ නිසා මෙම අයවැය අද දින සම්මත කළයුතු බව ප්‍රකාශ කරන ලදි.අපි සියලුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා භාර ගත් බවත්,විපක්ෂය මෙම අයවැය ප්‍රතික්ෂේප කරනවා නම් අපට තීරණයක් ගැනිමට තිබුණා ගමේ තිබෙන ප්‍රජා ශක්ති කමිටු හරහා යෝජනා ගෙනේන ලෙසටත්,එසේ නොකළ බව ද එතුමා ප්‍රකාශ කරන ලදි.ඊළඟට අපි බලාපොරොත්තු වුණා පෞද්ගලිකව ගමට සංවර්ධන වැඩකටයුතු කිරිමට එක් මන්ත්‍රීවරයකුට ලක්ෂ 05 බැගින් ලබාදීම යෝජනාවක් ගෙන ඒමට එහෙත් දැන් එම යෝජනාව හකුලා ගන්නා බව ප්‍රකාශ කරන ලදි.ඒ වගේම ගමේ සංවර්ධන කටයුතු හා සභාවේ සංවර්ධන කටයුතු තනි පක්ෂයක්,ආණ්ඩුවක් විදිහට පවත්වාගෙනයන බව ප්‍රකාශ කරමින් 2026 අයවැය යෝජනාව සම්මත කරන බව ප්‍රකාශ කරමින් නිහඬ වන බව පවසන ලදි.

- **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සංවාදයවත් නොකර මෙතැනින් පිටයාම ගැන කණගාටු වෙන බවත්, ඒ වගේම සිංහයෙක් වගේ නොසැලී නන්දික මන්ත්‍රීතුමාගේ රැඳිසිටිම් ඉතා අගය කොට සලකන බව ප්‍රකාශ කරන ලදි.එතුමා ආණ්ඩුවේ ප්‍රතිපාදන බලාපොරොත්තුවෙන් නොවන බවත්,එතුමාට ඡන්ද ප්‍රමාණයක් ලබා දි ඇති මහජනතාව වෙනුවෙන් සිටිය බවත් එය අගය කොට සලකන බවත් ප්‍රකාශ කරන ලදි. ඒ වගේම සභාපතිතුමනි,පැහැදිලි කිරීමක් අවශ්‍යයි.අයවැය සමාන කර ගන්න කොට පළාත් සභාවෙන් ලැබෙන මුද්දර ආදායමට ලැබෙන දින හා කාලවකවානු සම්බන්ධව දැන ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. මේ වන විට 2025 ට මිලියන 51 ක්ද 2026 47 ක්ද වන බව පවසන ලදි.මේ අයවැය සමාන කර ගන්න කොට ලබන වසර තුළට කොහොමද පුරෝකථනය කර සිදු කරන්නේ කොහෙම ද බවත්,හම්බවෙන්නේ කොයි වගේ කාලවකවානුවලදී ද කියන එක පැහැදිලි කිරීමක් කරන්න ලෙස ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විරෝධය මැද මම තීන්දුවක් ගත්තා වෙනත් දිනයක් ලබාදීමත්, එහෙත් එය නොසලකා විපක්ෂයේ මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් පිටත ගිය බවත්, මාස හයක පුරාම බොහොම සහයෝගයෙන් භේදයකින් තොරව සාධාරණව වැඩ කිරිම උත්සහ කළ බවත්, අපි කවුරුත් පැමිණ සිටින්නේ මහජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් බවත්,ප්‍රකාශ කරන ලදි. අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී විනයානුකූල පක්ෂයක් බවත්, ඒ වගේම උපසභාපතිතුමන් මතු කරන කාරණය ගැන අපි කවුරුත් දැනුවත් වෙන එක හොඳ බවත් ප්‍රකාශ කරන ලදි. අපේ ආදායම කියන්නේ අපේ පුරෝකතනයක් මෙහෙම උපයා ගන්න පුළුවන් නිසා හා මුද්දර ගාස්තු ලැබෙයි කියලා හිතන බවත්,එයට තහවුරුවක් දෙන්න නිර්ණායකයක් නැති බවත් ප්‍රකාශ කරන ලදි.උදාහරණ වශයෙන් වරිපනම් බදු ගත්තොත් වරිපනම් බදු මාසෙට කොපමණ ප්‍රමාණයක් එකතු වෙනවද කියන එක පුරෝකථනයක් බව ප්‍රකාශ කරන ලදි.පැහැදිලි සහතිකයක් නැති බවත්, තිබෙන්නේ ඇස්තමේන්තු ගත දත්ත පමණක් බවත්, ලේඛනගතව සහ මුද්දර බදු වල පුරෝකථනයක් බවත් ප්‍රකාශ කරන ලදි.මෙය අඩු වැඩි වියහැකි බවත්, මෙය සමාන කර ගැනිමට ගැටලුවක් තිබෙන බවත්,වියදම් වලින් අඩු කර ගැනිමට සිදු වෙන බවත් ප්‍රකාශ කරන ලදි.මුලදීම යෝජනාවක් කළා මිලියන හතරක් වෙන් කරනවා ප්‍රාග්ධන වියදම් වලට එම මුදලින් අඩු කර ගැනිමට සිදුවන වුවහොත් අයවැය අතිරික්තයක් අරමුදල ලැබුණොත් මිලියන 18ක් වෙන බව ප්‍රකාශ කරන ලදි. ඒ ටික

ලැබුණොත් තමයි අපට සමාන කරගන්න වෙන බවත්, ඒ වගේම වියදම් සීමා කරන්නත් සහ වියදම් කප්පාදු කරන්නත් වෙන බව ප්‍රකාශ කරන ලදි.උදාහරණයක් වශයෙන් සභාපතිවරයා හැටියට මට පෞද්ගලික ලේකම් කෙනෙක් ලබා ගැනීමට පුළුවන් බවත්,පනතෙන් රු15,000.00 ක දීමනාවක් වෙන් කර ඇති බවත්,එය මාස හයක් පාවිච්චි නොකළ බවත් පවසන ලදි.ඉදිරියටත් එසේ කිරීමෙන් රු180,000.00 ක මුදලක් ඉතිරි වන බව ප්‍රකාශ කරන ලදි.ඒ වගේ වියදම් කප්පාදු කරලා තමයි මේක සමාන කරගන්න වෙන බවත්,ඒ වගේම කැපකිරීම කරන්න වෙන බවත් ප්‍රකාශ කරන ලදි.අලුත් ආදායම් උත්පාදන මාර්ගවලට යන්න වෙන බවත්, පෞද්ගලික බස් නැතුම්පොලෙහි වාහන නැවැත් වීමෙන් ලබා ගන්නා ගාස්තු අය නොකරන බැවින් ඒවා අතහැර දමා ඇති අදායමකි එවැනි අදායම් ලබා ගැනීම අවශ්‍ය බවත් සඳහන් කරන ලදි. ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘති මඟින් බස් නැවතුම්පොළෙහි වැසිකිලි අලුත් වැඩියාව සිදු වෙන බවත්,එයට ටෙන්ඩර් ප්‍රධානය කිරීමට සූදානම් කර ඇති බැවින් එයින්ද යම් ප්‍රමාණයක ආදායමක් වැඩි කරගන්න පුළුවන් බවත්,ප්‍රකාශ කරන ලදි. අප සතුව තිබෙන වහව භූමියට ව්‍යාපෘතියක් ලැබී තිබෙනව බවත්,එය අධිවේගී මාර්ගය පාවිච්චි කරන ජනතාව වගේ සංචාරක කලාපයක් බවට පරිවර්තනය වෙමින් තිබෙන නිසා ඔවුන් සඳහා සේවාව සැපයීමට ඇති ස්ථාන ලෙස සූදානම් කිරීමත්, එයින් යම් ප්‍රමාණයක ආදායමක් ලැබීමෙන් ඊළඟ අවුරුද්දේ මැදවන විට ආදායම් පැත්ත වැඩි කර ගතහැකි බවට විශ්වාස කරන බව සඳහන් කරන ලදි. මන්ත්‍රීතුමන්ලා/තුමයන්ලා අවධානය යොමු කරන්න තමන්ගේ ප්‍රදේශයේ ආශ්‍රිත ආදායම් උත්පාදන ක්‍රමවේදයක් තිබෙනවා නම් යම් ආයෝජනයක් කරලා උපයා ගැනීමට එවිට මෙම ප්‍රශ්නයට පිළිතුර ලැබෙන බවත්, ඒ ආකාරයෙන් අපිට ප්‍රතිපූර්ණ කරගන්නට පුළුවන් බවත්,ප්‍රකාශ කරන ලදි. ඒ වගේම රජයෙන් අවුරුද්දට 20% ක වැටුප් කප්පාදුවක් කර ඇති බවත්, ඊළඟ අවුරුද්දෙත් 20% ක වැටුප් කප්පාදුවක් සිදු වීමෙන් 40% වැටුප් කප්පාදුවක් සිදු වෙන බවත්,මිලියන 18 ක ආදායම් අතිරික්තයක් ළඟා කර ගැනීමටඋත්සාහ කළේ මේ වියදම් සීමා කර ඇති නිසා බවත් ප්‍රකාශ කරන ලදි.

ට්‍රැක්ටර් රථ දිරාපත් වී තිබෙන බවත්, රථ වාහන නඩත්තුවට විශාල මුදලක් වියදමක් කිරීමට සිදු වන බවත්, ප්‍රකාශ කරන ලදි.පළාත් පාලන ආයතන වලට අවශ්‍ය යානවාහන වල අවශ්‍යතාවය ලබාදී ඇති බවත්, එම යන්ත්‍ර ලබා ගැනීමට හැකිවීමෙන් එම නඩත්තු වියදම් ඉතිරි කර ගැනීම හැකි බවත්, එම මුදල්ද ප්‍රාග්ධන වියදම් පැත්තට නැවත යොදා ගැනීමට පුළුවන් වීමෙන් මේ අයවැය සමාන කර ගැනීමට හැකිවන බවත් ප්‍රකාශ කරන ලදි.ඔබතුමාලාට මේ සඳහා අදහස් හා යෝජනා දැක්වීමට අවස්ථාවක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.අයවැයෙහි විශේෂ වැඩසටහන් සියල්ල ආවරණය වන පරිදි වැඩසටහන් ඇතුළත් කර ඇති බවත්,ඉලක්කම් හරඹයක් නොවන බවත්, මහජන ඉල්ලීම් යෝජනා තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි. නමුත් අපිට අයවැයට ඇතුළත් කිරීම අවසර තිබෙන්නේ සභාව සතු දේපල සංවර්ධනය කිරීමටත්, වියදම් කිරීමටත් පමණක් බවත්, මාර්ග සංවර්ධනයට මධ්‍යම රජයේ මුදල් ප්‍රතිපාදන වෙන් වෙන බවත් ප්‍රකාශ කරන ලදි.ජයවීර මැතිතුමාගේ කොට්ඨාශයේ පාලම සකස් කිරීමට හා රෝහණ මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ පාලම සඳහා ක්ලීන් ශ්‍රී ලංකා යටතේ ආධාර ලැබෙන බවත් පවසන ලදි. පුනරුදය යන අවස්ථාවේදී ජනතාවට සේවය කිරීමට අපට ඒකට පාරට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදි.මීට පෙර මහජනතාවගේ සුභ සිද්ධිය නොසලකා වැඩ කරලා තිබෙන බවත් පවසන ලදි.අපට අවුරුදු හතරක් තිබෙන බැවින් සාධනීය යෝජනා මගින් කණ්ඩායමක් විදියට රඹුක්කන පුරවරයේ මූලික අවශ්‍යතා සපුරා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.මෙම අයවැය සඳහා අවශ්‍ය සංශෝධන සඳහා කාලය ලබා දෙන බව සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන්ද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමාගෙන්ද අවසරයි! රඹුක්කන ආසනයේ,රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ඉදිරි වර්ෂය සඳහා සැලසුම් කර ගත් අයවැය අපි බලාපොරොත්තු වූ ආකාරයට ඉදිරිපත් කිරීමට සූදානම් වීම ගැන සතුටුදායක බවත්, මාස හය, හතක කාලයක් තුළ ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු කරගෙන යාමේදී විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සමඟ සුපරික්ෂාකාරීව වැඩ කටයුතු කළ බවත් පවසන ලදි.එතුමන්ලා සමඟ සහයෝගය වැඩ කටයුතු කරමින් ආසනයේ ජනතාවගේ සිදු කළ සේවාවත්, මෙහිදී සියලු දෙනා එකට ගැට ගසාගෙන වැඩ කටයුතු කරගෙන යාමට උත්සාහ දැරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුදකරන බව සඳහන් කරන ලදි. මේ අයවැය යෝජනා කෙටුම්පත ලැබූ දින සිට ඉතා හොඳින් සාකච්ඡා කර ගත් බවත්. මතු වූ ගැටලුව තමා

ඔබතුමා කොහොමද මේ කළමනාකරණය කරන්නේ 20% ක ආදායමක් අපට නැති වෙනවා. රජයෙන් ලැබෙන ආදායමෙන් අපේ සභාවේ වැඩකටයුතු කරගෙන යන්න ඔබතුමාට දැක්මක් තිබෙන්න ඕන. ලබන වර්ෂයේද 20% ක නැතිවෙනවා. තවත් ගැටළු රාශියක් තිබෙනවාද ඒකත් හිස මත තබාගෙන මේ අයවැය ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. කණගාටුවක් තිබෙනවා මේ අයවැය සාකච්ඡාවට විපක්ෂය නැති වීමත්,ඔවුන්ගේ යෝජනා හා අදහස් වලින් ඉදිරි වැඩ කටයුතු කර ගෙන යාමට බලාපොරොත්තු විය නොහැකි වීම නිසා මගේ පෞද්ගලික කණගාටුව ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදි.

මගේ කොට්ඨාසය දියුණු කිරිමේදී පැණ නැඟුණු ගැටලුව තමා කසල කළමනාකරණය.මෙම ප්‍රදේශයේ මොරගොල්ල,මල්බේරි වත්ත යන ගම්වල දියුණු මට්ටමේ ජනතාව සිටින බැවින් කසළ බැහැර කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කරන අතර ඉදිරියේදී මොනයම් හෝ සැලසුමක් සකස් කර දෙනවා නම් හොඳ බවත් පවසන ලදි. මේ සඳහා පුස්තකාලයේ ඉඩම ද පාවිච්චි කිරීමට හැකි බවත්, කසල කළමනාකරණයට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ද ඉල්ලා සිටිනවා.මගේ විෂය පථයට අයිති පුස්තකාල සහ සාහිත්‍ය කටයුතු සකස් කිරීම පසුගිය වසරට සම්බන්ධව සාහිත්‍ය උත්සවයක් පැවැත් වූ බවත්, ඉදිරියේදී කලාව හා සාහිත්‍යයේ අපේ ගම්වල මිනිසුන් අතරට ගෙන යාමට විවිධ යෝජනා සම්බන්ධ කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන බව ද පවසන ලදි.යටිතල පහසුකම් ගැන දැඩි අවධානයක් දක්වන අතර අපෙන් ගිලිහුණු සාහිත්‍යය හා රසවින්දනය කරන්නේ කොහොමද කියන එක ගම්වල ජනතාව අතරට රැගෙන යන්නට වැඩපිළිවෙලක් සකස් කිරීමටත් ඒවා කළමනාකරණය කර ඉදිරි වර්ෂයේ කිරීමට බලාපොරොත්තු වන බවත්, අයවැය තුළින් ලැබෙන ප්‍රතිපාදන අපේ ජනතාව වෙත බෙදාහැරීමටත්, ඔබතුමාට සමග වැඩ කිරීමට සූදානම් බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන්ද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමාගෙන්ද අවසරයි!විපක්ෂය එලියට ගියාට අපි කණගාටු නොවන බවත්,නන්දික බණ්ඩාරනායක මැතිතුමා රැඳී සිටීම පිළිබඳ ස්තුතිවන්ත වෙන බවත් ප්‍රකාශ කරන ලදි. ඒ අය හිටියට පක්ෂව ඡන්ද නොදෙන බවත්,විවාද දක්වන බවත්,සඳහන් කරන ලදි. එය ඒ අයගේ ප්‍රතිපත්තිය බවත්, දැන් ගත් තීරණයක් නොවන බවත්,කලින් සැලසුම් කර සිදුකළ දෙයක් බවත්. ප්‍රකාශ කරන ලදි.සභාපතිතුමා රැඳී සිටිමට පැවසුවත්,ඔවුන් සභාගර්භයෙන් පිටත් වුණේ ඒ නිසා බව ප්‍රකාශ කරන ලදි.මෙම අයවැයෙහි සංවර්ධනය සඳහා පොඩි මුදල් ප්‍රමාණයක් තිබෙන බවත්,ඉතිරි මුදල් මධ්‍යම රජයෙන් එන මුදල් බවත්, ප්‍රකාශ කරන ලදි.විපක්ෂයේ යෝජනා මෙහි සාකච්ඡාවට භාජනය වුණ බවත්,මොකද අපට මධ්‍යම රජයෙන් එන ප්‍රතිපාදන වලින් කිරීමට හැකියාව තිබෙන නිසා ඒ අයට මෙම ප්‍රතිපාදන වලින් ලබාදිමට සුදුසුයි කියන තැන අපි හිටිය බවත්,ප්‍රකාශ කරන ලදි. සාකච්ඡා කිරිමට වෙනත් දවසක් දුන්නත් එකහයි කියලා පවසන්නේ නැති බවත් ප්‍රකාශ කරන ලදි. අපේ මන්ත්‍රීවරු කණ්ඩායමක් සිටින බවත්,මම විශ්වාස කරනවා මෙතුමන් මේ වෙනුවෙන් පෙනී සිටියි කියලා.මෙම අයවැයෙහි ඇතුළත්ව ඇත්තේ සභාව නඩත්තු කිරීමට හා රඹුක්කන බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීමට බවත්,විවිධ අදහස් වලින් නම් වලින් යොදා තිබුණත් සිදුවන්නේ එකම දෙයක් බවත්,ඒ නිසා අපි මේ අයවැය සම්මත කර ඉදිරි වැඩ කටයුතු වලට යන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙහි අංක 120 යටතේ තිබෙන වාරිපනම් බදු හා අක්කර බදු ගණන ගත්විට පරිපනම් බදු 2024 වර්ෂයේ සත්‍යය ලැබිම් මිලියන 06 ක්ද එය මෙවර මිලියන 10 ලෙස ඇත්තමේන්තුගත කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි.අක්කර බදු මිලියන 10,000.00 ක් ඇස්තමේන්තු කරගෙන තිබුණත් මෙවර මිලියන 45000 ක් ලෙස ඇත්තමේන්තුගත කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි. යෝජනා කරන්න කැමතියි පරිපාලන අංශයේ සිටිනවා ආදායම් එකතු කරන කණ්ඩායමක්. එම කණ්ඩායම සඳහා අංශ ප්‍රධානයේ පත් කිරිම මඟින් අපට මෙම ඉලක්කවලට යන්න පුළුවන් බව සිතන බව ප්‍රකාශ කරන ලදි.ඒ නිසා කණ්ඩායම අධීක්ෂණය කරන අංශ ප්‍රධානියෙක් පත්කිරීම හොඳ බවත්,මේ අයවැය ඉලක්ක වලට යාමට හැකියාව තිබෙන බවත්,ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.අයි.සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන්ද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමාගෙන්ද අවසරයි!පළමුවෙන් ස්තූතිවන්ත වෙනවා නන්දික මන්ත්‍රීතුමා රැඳී සිටීම සම්බන්ධව යනුවෙන් ප්‍රකාශ කරන ලදි.මේ තමයි සත්‍යය, සැම විටම විපක්ෂයේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදි. අපි ජනතාව වෙනුවෙන් සේවය කිරිමට බලාපොරොත්තුවෙන් මෙම අයවැය සම්මත කර ගන්න සැලසුම් සකස් කළ බවත්, මා නියෝජනය කරන වසමේ කනත්ත මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කර සංවර්ධන කිරීමට යෝජනා කරන බවත්,ඒ ගැන අවධානය යොමු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි. ඒ වගේම රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ඉඹුල්ගස්දෙනිය ප්‍රදේශයේ ඇති ඉඩමක එහි ආදායම දැනට ලබා ගන්නේ හිටපු ප්‍රාදේශී සභා මන්ත්‍රීවරයෙක් බවත්,ඒ ගැන ද අවධානය යොමු කර සුදුසු ක්‍රියාමාර්ගයක් ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන්ද අවසරයි!මම අද මෙතන සිටින්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට වැඩිය ස්වාධීන මන්ත්‍රීවරයෙක් විදිහට බව ප්‍රකාශ කරන ලදි. ඡන්දය පන්සියයකට ආසන්න සංඛ්‍යාවක් ලබාගෙන කුඩාගම කොට්ඨාසයේ මන්ත්‍රීවරයකු ලෙස පත් වී මෙතැනට පැමිණියේ තනියම තරග කරලා එම නිසා මට පක්ෂයක් නැති බවත්, පවසන ලදි.ඒ නිසා මට පක්ෂයක් වශයෙන් තීන්දු තීරණ ගන්නට නොහැකි බවත්, ස්වාධීනව තීරණ ගන්නට හැකියාව ඇති බවත් ප්‍රකාශ කර සිටියහ.මගේ කාර්යභාරය හා වගකීම මගේ කොට්ඨාසයේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කිරිමටත්.ඒ විශ්වාසය මත ඡන්දය ලබා දී තිබුණ බවත් ප්‍රකාශ කරන ලදි. ජනතාවට සේවය කර තිබෙන බවත්, ඉදිරියටත් ජනතාවට සේවයකිරිමට අවශ්‍ය බැවින් මෙහි රැඳී සිටි බවත්, ආණ්ඩුවේ ප්‍රතිලාභ හා විශේෂ වරප්‍රසාද ලබා ගැනීමටවත් නොව බව ප්‍රකාශ කරන ලදි.අපේ ප්‍රදේශයේ තවත් මන්ත්‍රීවරු දෙදෙනෝ සිටින බවත්, ඒ නිසා මහජනතා සිතනවා අනිත් කොට්ඨාශ වලට වඩා වැඩි වැඩ කොටසක් කිරිමට පුළුවන් බවත් පවසන ලදි. මේ වන විට අධිවේගී මාර්ගය සකස් කිරිම නිසා දොඹේමඩ ජනතාව සැහෙන පීඩාවකට ලක් වී සිටිනවා වර්ෂාව නිසා ළිං වලට ගල් ,වැලි, පස් ගොස් පානීය ජලයට එකතු වී ඇති බැවින් එම ජලය බීමට ගැනිමට නොහැකිව එයට විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි. අයවැය ලේඛන දෙස බැලුවිට වසම් 15 ක් තිබෙන බවත්, මෙහි මගේ යෝජන අඩංගු වී නොමැති බවද පවසන ලදි.

අපේ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කර ඇති යෝජනා කාලෝචිත නොවන අතර මීට වඩා වැදගත් යෝජනා පවතින බව පවසන ලදි. මගේ මන්ත්‍රී ධූර කාලයේ පවතින තුරු මම ස්වාධීන මන්ත්‍රීවරයකු ලෙස සිටින අතර නිවැරදි දේ කිරීමටත් වැරදි දේ පෙන්වා දෙමින් නිවැරදි මාවතට ගෙනයාමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.මන්ත්‍රී ධූරයේ දිගටම රැඳී සිටීමට අදහස් නොකරන අතර නවකයෙකුට එම අවස්ථාව දීමට අපේක්ෂා කරන බවත්, කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදෙන මෙන් ඉල්ලා සිටියහ.තවද සැවොම සහෝදර කණ්ඩායමක් ලෙස එකට එක්ව මහජනතාවට සේවය සැලසීමටත් විපක්ෂ මන්ත්‍රීන් සභාගර්භයෙන් ඉවත්ව ගිය එක සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විශේෂයෙන්ම නන්දික මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුති වන්ත වන බවත්, තම ස්වාධීනත්වය සාධාරණ ලෙස යොදා ගැනීම ගැන ගෞරව කරන බවත් ප්‍රකාශ කරන ලදි.ජන වරමට ගරු කරමින් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රඹුක්කන බල ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා කටයුතු කරන ලෙසත්, අයවැයට ඉදිරිපත් කර ඇති උපසභාපතුමාගේ යෝජනාවක් තවම සාකච්ඡා මට්ටමේ පවතින බවත්,වරිපනම් බදු අය කර ගැනීමට ක්ෂේත්‍රයේ යන නිලධාරීන්ගේ හා ව්‍යාපෘතිවලට සම්බන්ධ නිලධාරීන්ගේ ආරක්ෂා තහවුරු කර ගැනීම සම්බන්ධය යම් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත්,වංචාව දූෂණයෙන් තොරව මහජනතාවට ප්‍රතිලාභ සලසා දිමට යෝජනා කළ අතර සංචාරක කලාපයක් බැවින් සංචාරයට සුදුසු වටපිටාවක් සකස් කරමින් ආදායම් උත්පාදන අවස්ථා බිහිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමුයි ප්‍රකාශ කළ අතර 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කළ මෙම අයවැය කෙටුම්පත ස්ථිර කරන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාගෙන්ද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමාගෙන්ද අවසරයි!පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව පෙරදැරි කරගෙන රඹුක්කන ප්‍රාදේශීය සභාවේ බහුතර බලය ලබාගෙන පාලනය පත් වූ බවත්,මීට පෙර පැවැති පාලන කාලයන් හා සභාව පිහිටුවීමට පෙර තිබූ නිලධාරි පාලනයත් නිසා අපහට තීන්දු තීරණ ගැනීම ඉතා අසීරු තත්ත්වයක පැවතුණ බවත්, පළමු අයවැය ඉදිරිපත් කිරීම මෙලෙස සාර්ථක කර ගැනීමට හැකිවීම සම්බන්ධව සතුට ප්‍රකාශ කළ අතර 2027 වර්ෂයේ අයවැය මගින් මීටත් වඩා වැඩි ප්‍රමාණයකින් මහජනතාවට ප්‍රතිලාභ ලබාදීමට බලාපොරොත්තු වන බවත්,සභාපතිතුමා ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත සභා සම්මත කරගැනීම සඳහා ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව විපක්ෂයේ එක් ස්වාධීන මන්ත්‍රීවරයෙකු හැර විපක්ෂයේ අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන් සභාගර්භයෙන් ඉවත් වූ අතරඑ ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් 2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සභා සම්මත විය.

තීරණය -
2026 වර්ෂයේ අයවැය කෙටුම්පත සුදුසු බවට තීරණය විය.

සභාගර්භයෙන් ඉවත්ව ගිය විපක්ෂ මන්ත්‍රීවරුන් පෙ.ව 11.47 නැවත සභාව වෙත පැමිණෙන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
දෙවැනි යෝජනාවේ සිට දාහත්වැනි යෝජනාව දක්වා සභා කටයුතු සඳහා පවතින යෝජනා සියල්ල එකවර සභාවට යෝජනා කරන බවත්, පසුව එකින් එක සාකච්ඡාවට භාජනය කරමු යැයි ප්‍රකාශ කරන ලදී එම යෝජනා ගරු ප්‍රාදේශීය මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ii. ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට අවශ්‍යව පවතින නව හලර් යන්ත්‍රය ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යටතේ සපයා ගැනිම සඳහා මිල ගණන් කැඳවීමට අනුමැතිය ලබා ගැනිමට කමිටුව මගින් සකස් කරන ලද පිරිවිතර සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කසල අංගනයේ නිරීක්ෂණය කළ විට හලර් යන්ත්‍රයක් අවශ්‍යය වන්නේ කුමක් සඳහාද යන්න තේරුම් ගත හැකි බවත්,වර්තමානයේ කොම්පෝස්ට් නිපදවීමට භාවිතා කරන යන්ත්‍රය සඳහා මිනිස් ශ්‍රමය යොදාගන්නා බවත්, වැඩිදුරටමේ සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා උපසභාපතිතුමාට අවස්ථාව ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
සභාව ආරම්භයේ කොම්පෝස්ට් නිෂ්පාදනය ඉතා පහළ මට්ටමක පැවැති අතර ඒ සම්බන්ධව තොරතුරු සොයා බැලීමේදී කසල එක් රැස් කිරීමේදී ඒවා වෙන් වෙන් වශයෙන් ලබා නොගැනීම ප්‍රමුඛ ගැටලුවක් බව පෙනී ගිය බවත්, දැනට පවතින යන්ත්‍රය කාර්යක්ෂම නොවන බවත්, ශ්‍රමදායකත්වය අවශ්‍ය බවක් පෙනී ගිය බව ප්‍රකාශ කරන ලදී.එබැවින් නවීන හලර් යන්ත්‍රයක් ගැනීම සුදුසු බවත්,ඒ සම්බන්ධ නියමිත පිරිවිතයන්ම අනුව පළාත් සභා තාක්ෂණ නිලධාරියකු මගින් සකස් කර ගත් බවත්, මිල ගණන් කැඳවීම සඳහා ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගැටලුවක් නොමැති බව පෙනී යන බැවින් අනුමත කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

නව හලර් යන්ත්‍රය සපයා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති පිරිවිතර වලට අනුව මිල ගණන් කැඳවිම අනුමත කිරිම තීරණය විය.

iii. 2025/10/08 දින මහා සභාවට ඉදිරිපත් කරන ලද 2026 වර්ෂයට අදාල ගාස්තු අයකිරීම් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කල යෝජනාව සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>දෙවන කොටස</u>

01.බල ප්‍රදේශය තුල එක් ආදාහනයක් කිරීම සඳහා ගාස්තුව - රු.12,500.00
02.බල ප්‍රදේශයෙන් පිටත එක් ආදාහනයක් කිරීම සඳහා ගාස්තුව - රු.18,000.00
03.විජයමන්නාහේන සුසාන භූමියේ මිහිදන් කිරීමේ ගාස්තුව - රු. 500.00

ප්‍රචාරක දැන්වීම් දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම් වලට අදාළ

උපලේඛනය

| විස්තරය | වර්ග අඩි 01 කට රුපියල් රු.ශත |
|---|---|
| බැනරයක් මඟින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය | 40.00 |
| කටවුට් | 50.00 |
| ස්ථිර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරිම | 150.00 |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පසුගිය වාරයේ දී රු10,000.00 ක් ලෙස ගෙනා යෝජනාව නැවත රු 12,500.00 ක් ලෙස ගෙන ඒම සුදුසු නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගිය වර ඉදිරිපත් කරන ලද යෝජනාවෙහි සංශෝධනයක් මෙවර ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

ජොෂ්ඨ මන්ත්‍රීතුමාට ගරු කරන අතර ප්‍රාදේශීය සභා පනත හා රීති හොඳින් අධ්‍යයනය කරන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යෝජනාව සම්බන්ධය ගැටළු නොමැති බැවින් අනුමත කරන ලදී

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත ගාස්තු 2026 වර්ෂයට අදාලව අයකිරීමට ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා අනුමැතිය ලබාදිම තීරණය විය.

iv. ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය වෙත අවශ්‍ය 37.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 6 ක් Kegalle Disrtributers (pvt) ltd වෙතින් ද, 37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර් 6 ක් A.K.W පුෂ්පකුමාර , ලීලා ස්ටෝර්ස් වෙතින්ද වෙළඳපල පවත්නා මිල ගණන් යටතේ සපයා ගැනිමට හා ඒ සඳහා ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගෙවීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
යෝජනාවේ සඳහන් ආයතන මඟින් ගෑස් සිලින්ඩර් වෙළඳපල පවත්නා මිල ගණන් යටතේ සපයා ගැනිමට හා ඒ සඳහා ගෙවීම් කිරිමට අනුමත කිරිම තීරණය විය.

v. නවගමුව අරබ්බඩ හාල්පාන් කුඹුර පාර බොරලු පස් හෝ ගල්පස් යොදා සකස් කර ගැනිම සඳහා රු.482,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
විස්තර කිරිම පැහැදිලි නැත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මන්ත්‍රීතුමාගේ අදහස නිවැරදි බවත්, අධික වර්ෂාව නිසා  භාවිතා කරන මහජනතාවගෙන් ඉල්ලීම් ලැබී තිබෙනවා.මාර්ග භාවිතා කිරීමට අපහසු බවත්, ගල්පස යොදා ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසට එබැවින් අබලන් වූ මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා කාර්මික මහත්වරුන් මඟින් ස්ථානීය පරීක්ෂාව සිදුකර සකස් කරන ලද ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**
මෙම යෝජනාව සඳහන් කිරීමේ ගැටලුවක් පවතින බව ප්‍රකාශ කළ අතර එය බොරලු පස් හෝ ගල්පස් යොදා සකස් කිරීම නොව කොන්ක්‍රීට් කර අලුත්වැඩියා කිරිම විය යුතු බව දන්වා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
බොහෝ ගම් ඇතුළට යන්න යන්න දුෂ්කරතා බොහෝ පවතින අතර ඒවා අධික්ෂනයට  අප දිවා රාත්‍රී නොතකා කටයුතු කරන බවත්,මෙවැනි සංවර්ධන යෝජනා විගණනයට ලක්වන බවත්, එහිදී යම් අක්‍රමිකතාවක් පවතින බව හෙළි වුවහොත් සභාපති විදියට මා ඒ සම්බන්ධව පිළිතුරු දීමද සූදානම් බවත්, ආක්‍රමිතා නොවන ලෙස කටයුතු සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදී.
මෙම මාර්ගය දසනායක මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ බැවින් එතුමා ඉදිරිපත් කළ කරුණු අනුව එම සංශෝධනයට යටත්ව මෙම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට සකස් කරන ලද ඇස්තමේන්තුව අනුමත කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.482,000.00 ක වටිනාකමින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරිමට තීරණය විය.

vi. නාඹිරිත්ත මුකලාන පාර සංවර්ධනය කිරිමේ ඇස්තමේන්තුව රු.850,000.00 අනුමැතියට ඉදිරිපත් කරමි. 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ ප්‍රජා පාදක සංවිධානයක් හරහා ඉටුකර ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

විස්තර කිරිම පැහැදිලි නැත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ප්‍රතිපාදනය වී ඇත්තේ ප්‍රාදේශයේ සභා අරමුදල් මුදලින් ද? නැත්නම් පළාත් සභා අරමුදලින්ද? යන්න වැදගත් නොවන බවත්, අදාල ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම වැදගත් බව ප්‍රකාශ කළ අතර සභාවේ දැනගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන බැවින් මීළඟ සභා වාරයට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.850,000.00 ක වටිනාකමින් යුතු ඇස්තමේන්තුව අනුමත කිරිමත්, ප්‍රජා පාදක සංවිධානයක් හරහා ඉටුකර ගැනිම අනුමත කිරිමත් තීරණය විය.

vii. රඹුක්කන ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ බාහිර බිත්ති තින්ත ආලේප කිරිම වෙනුවෙන් සකස් කල මිලියන 3.5 ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
රඹුක්කන ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කිරිමට හා බාහිර බිත්ති තින්ත ආලේප කිරිම සඳහා සකස් කළ මිලියන 3.5 ක ඇස්තමේන්තුව සඳහා ගරු සභාවේ විරෝධතාවක් නොමැති බැවින් මෙම යෝජනාව සම්මත වු බවට ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මිලියන 3.5 ක ඇස්තමේන්තුව අනුමත කිරිමට තීරණය විය.

viii. රඹුක්කන ප්‍රාදේශිය සභාව සතු RE 2261 ට්‍රැක්ටර රථයේ ක්ලච් පද්ධතිය හා බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කල අතර එහි ස්ටාටර් මෝටරය සහ රියදුරු අසුනද අලුත්වැඩියා කරන ලදි. එම අලුත්වැඩියාව වෙනුවෙන් රු.208,500.00 ක මුදලක්(බි.අ. 11 දිනය -2025.10.09) මීදුම, මිහිඳුපුර තරිඳු මෝටර්ස් ආයතනය වෙත ඒ නමින් ගෙවිමට අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සැ.යු.
- ලියාපදිංචි හා සුදුසුකම් ලත් ආයතනයක් වන තරිඳු මෝටර්ස් වෙතින් ලබා ගත් මිල ඇස්තමේන්තුව 2025.08.05 මහ සභාව ඊ:1:(xii) තීරණය මගින් අනුමත වි ඇත.
- අලුත්වැඩියාව පෙර හා පසු ඉංජිනේරු වාර්තා අමුණා ඇත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව ඊළඟ සභා වාරයට යොමු කරන බවත්, මුදල් කමිටුවට ඉදිරිපත් කර පරීක්ෂාවට ලක් කිරිමෙන් අනතුරව ගෙවීම කටයුතු සිදුකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවත්, මෙම යෝජනාව මුදල් කමිටුවට මේ ඉදිරිපත් නොවු බැවින් එයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සභාවට ඉදිරිපත් කිරීම් සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

තීරණය -
පරික්ෂා කිරිම සඳහා මුදල් කමිටුවට යොමු කිරිමෙන් පසුව ගෙවීම් කිරිම සඳහා ඊළඟ සභාවාරයට ඉදිරිපත් කිරිම තීරණය විය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
හයවැනි යෝජනාවට අදාළ ප්‍රතිපාදන පළාත් සභා අරමුදලින් බව ප්‍රකාශයට පත් කරන ලදි.

ix.

| | | |
|---|---|---|
| PF -7429 / කැබ් රථය /ඉදිරි පිටුපස ටයර් මාරු කිරිම වෙනුවෙන් | රු.800.00 | බි.අං.185 (2025.08.04) |
| RX -2006 /ටේලරය /වම් පස රෝදයේ පැච් දැම්ම වෙනුවෙන් | රු.600.00 | බි.අ.182( 2025.07.31) |
| RX-1980 /ගලි බවුසර් ටේලරය/ දකුනුපස රෝදයේ ටියුබයක් හා කොලරයක් දැමීම | රු.5,450.00 | බි.අ.030 (2025.1013) |
| | රු.6,850.00 | |

ඉහත වාහනවල ටයර් මාරු කිරීම , පැච් දැම්ම , ටියුබ් හා කොලර දැම්ම වෙනුවෙන් රු.6850.00 ක මුදලක් M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C. කුමාර නමින් ගෙවිමට අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.6850.00 ක මුදල M.L.ටයර් වර්ක්ස් ආයතනයේ P.G.L.C. කුමාර නමින් ගෙවිමට තීරණය විය.

x. රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු RX-1980 අංක දරන ගලි බවුසරයේ වම්පස රෝදයට 750* 16 ප්‍රමානයේ ටියුබයක් සහ 750* 16 3K කොලරයක් දැමීම වෙනුවෙන් රු.5050.00 ක මුදලක් මාවනැල්ල පාර රඹුක්කන හි වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් විල් එලයිමන්ට් වෙත ඒ නමින් ගෙවිම් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- රියදුරුගේ ඉල්ලීම හා අදාල ආයතනයේ බිල්පත අමුණා ඇත.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සභාව සතු ගලි බවුසරය ඉතා අබලන් තත්වයේ පවතින බවත්,ගෙවීම් කිරිමට අනුමැතිය ලබාදීම සුදුසු බවත්,ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.5050.00 ක මුදල වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් විල් එලයිමන්ට් වෙත ගෙවිමට තීරණය විය.

xi. රඹුක්කන ප්‍රාදේශීය සභාව ක්‍රියාකාරී ආයතනය වී ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා (සභා අරමුදල්, පළාත් සභා, මධ්‍යම රජය හා අනෙකුත්) ප්‍රජාපාදක සංවිධාන වලට තාක්ෂණික සහය ලබා දීම සඳහා

1. ප්‍රාදේශීය සභාවේ උප සභාපති - ඊ.ඩී.අශාන් ශානික කරුණාරත්න මයා
2. ප්‍රාදේශීය සභා මන්ත්‍රි - උපාලි රෝහණ මයා පත් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ප්‍රජාපාදක සංවිධාන හා වැඩකටයුතු සිදුකිරීමේදී ඒ සම්බන්ධව මාර්ගෝපදේශ මාලාවක් ඒවා ඇති බවත්, ප්‍රජාපාදක සංවිධානවල තාක්ෂණික දැනුම ඇති පුද්ගලයින් අල්ප බැවිනුත් වංචා, දූෂණ වීමට ඉඩකඩ ඇති බැවිනුත්, සභා මන්ත්‍රී

දෙපළක් වන මෙතුමන්ලාගේ තාක්ෂණ දැනුම හා පළපුරුද්ද ප්‍රජාපාදක සංවිධාන වලට ලබාදීමට කැමැත්ත විමසූ අතර ඔවුන් ඒ සඳහා එකඟත්වය ලබා දුන් බවත්, ප්‍රකාශ කරන ලදී

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීවරුන් විරුද්ධ බව ප්‍රකාශ කරන අතර කාර්යාලයේ ද තාක්ෂණික නිලධාරීන් සිටින බැවින් ඔවුන්ගෙන් එම සහාය ලබාගත හැකි බවත්, මන්ත්‍රීවරු ඒ සම්බන්ධව කටයුතු කිරීම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදී. තවද මන්ත්‍රීවරු සම්බන්ධ වී සිදුකරන ලද ව්‍යාපෘති කිහිපයක වංචා දූෂණ සම්බන්ධ උදාහරණ කීහිපයක් ඉදිරිපත් කරන ලදි. ඒ වගේම පක්ෂයේ නිලධාරීන් දෙපලක් මේ සඳහා යෝජනා කිරීම සම්බන්ධව විරුද්ධත්වය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

යෝජනාව වරදවා තේරුම් ගෙන ඇති බවත්,ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ එවැනි ආක්‍රමිකතා මීට පෙර ඇති වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.සමීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද උදාහරණ වලින් එකක් වන පැති බැම්ම ඉදිකිරීම සම්බන්ධ ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවට අදාළ නොවන බවත්,කරුණු කාරණා සොයා බලා සභාවට ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශයට පත් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ප්‍රජා මූල සමිතිවල ව්‍යාපෘති සම්බන්ධව තාක්ෂණික දැනුමක් නොමැතිවීම නිසා ඔවුන්ට තම ව්‍යාපෘති කරගෙන යාම සඳහා මුදල් ගෙවා හෝ තාක්ෂණික නිලධාරීන් සොයා ගැනීමට සිදුවන බවත්,එවැනි ආක්‍රීමිකතා වැළැක්වීම සඳහා මෙවැනි තාක්ෂණ නිලධාරීන්ගේ සහය ලබාදීමට අපේක්ෂා කරන්නේ යැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජනතාව ඔබලා මෙතනට පත්කර එවා ඇත්තේ ඔබතුමන්ලාගෙන් යම් සේවාවක් ආරක්ෂාවෙන් ඒබැවින් අණපනත් චක්‍රලේඛන හොඳින් අධ්‍යයනය කරන ලෙසත්, ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය බවත්, ප්‍රකාශ කරන ලදි.

විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්හට කොන්ත්‍රාත් කිරීමට අවස්ථාව ලබා නොදෙන බවත්,කොන්ත්‍රාත් ලබාදෙන්නේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුව බවත් ප්‍රකාශ කරන ලදි.

තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පිළිබඳව කෙටි හැඳින්වීමක්ද සිදුකරන ලද එහිදී කොන්ත්‍රාත්තුව සම්බන්ධව තාක්ෂණික දැනුම තිබේද? නැද්ද? යන්න විමසන බව කරුණු සහිතව ඉදිරිපත් කරන ලදී.

ඒ වගේම ප්‍රජා මූල සමිතිවල මෙම තාක්ෂණික දැනුම ඇති පුද්ගලයින් නොමැති තරම් බවත්,එසේ සිටියද ඔවුන් තම සහාය ලබාදීමට මැලිකමක් දක්වන බවත්,එහෙයින් මමත් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ඒ සහය ලබාදීමට සූදානම් බවත්, ඔවුන්ගේ ව්‍යාපෘතියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපාදන ලබා ගැනීම සහයක් වශයෙන් මෙසේ පත්කළ බවත්, ප්‍රකාශ කරන ලදි. මෙම යෝජනාව සම්බන්ධ ඡන්දයකට යාම සුදුසු බව ප්‍රකාශ කළ අතර පක්ෂ 17 ක්ද, විපක්ෂ 14 ක්ද මන්ත්‍රීවරුන් තුනදෙනෙක් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර ,ඒ අනුව වැඩි ඡන්දය යෝජනාව සම්මත විය.

අදාළ යෝජනාව වැඩි ඡන්දය සහා සම්මත විය.

තීරණය -

ප්‍රජාපාදක සංවිධාන වලට තාක්ෂණික සහය ලබාදිමට උපසභාපතුමන් වන ඊ.ඩී.අශාන් ශානික කරුණාරත්න මැතිතුමා හා ප්‍රාදේශීය සභා මන්ත්‍රි උපාලි රෝහණ මැතිතුමා පත් කිරිම අනුමත කිරීමට තීරණය විය.

xii. වෛද්‍යාධාර ලබා දීම සඳහා මුදල් අනුමත කර ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම්.සී.කමලාවතී, බෙලිගොඩපිටිය, රඹුක්කන. හා බී.ප්‍රේමවතී, වලිකොටුවවත්ත, රඹුක්කන. යන අයට රු.10,000.00 බැගින් වෛද්‍යාධාර ලබා දිම .(රු.20,000.00)

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගියවර ඉදිරිපත් කරන ලද වෛද්‍යාධාර ලබාදිම සම්බන්ධ යෝජනාවෙහි මුදල සඳහන් නොවූ බැවින් එම මුදල සඳහන් කර වර්ෂයකට එක් වරක් ලබාදිම සඳහා ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.ගැටළුවක් නොමැති බැවින් සම්මත විය.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
එම්.සී.කමලාවතී හා බී.ප්‍රේමවතී යන දෙදෙනා සඳහා රු10,000.00 බැගින් රු20,000.00 ක වෛද්‍යාධාර ලබා දිම අනුමත කිරිම තීරණය විය.

xiii. මෙම සභාව සතු නව පොදු වෙළඳපල අදියර 2 කඩ කාමර, පොදු වෙළඳපල අදියර 1 කඩ කාමර, කෑගල්ල පාර කඩ කාමර සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුකර නව තක්සේරු වාර්තාවක් එවා ඇත. එහෙයින් නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025.11.11 මස සභාවට ඉදිරිපත් වූ අතර එය ඉදිරි මාසයේ සිට ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

xiv. මෙම ප්‍රාදේශීය සභාවට අයත් නව පළමු වෙළඳ සංකීර්ණයෙහි පිහිටි හිස් ඉඩකඩෙහි ඉදිකිරීමට යෝජිත වූ කඩ කාමර බදු දීමේදී ඇති ගැටළු සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අදාල ලිපිය සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ඔහු විසින් එම මුදල් ගෙවීමට එකඟ වේ නම් හා නොවේ නම් ඒ සම්බන්ධව සභාවේ තීරණය ප්‍රකාශ කරන මෙන් දන්වා සිටියහ.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
පළාත් පාලන ආයතනය මගින් ලිපියක් ඉදිරිපත් කර තිබෙන නිසාත්, ඒ සම්බන්ධව තොරතුරු සොයා බලා වාර්තාවක් සකස් කළ යුතු නිසාත් කමිටුවක් පත්කර එම කමිටුව විසින් වාර්තාවක් සභාවට ඉදිරිපත් කර ඒ අනුව තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
වංචා හා දූෂණ වැළැක්වීමේ අරමුණින් එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ඉතා අගය කොට සලකන බවත්, ඒ අනුව ලිපිගොනු පරීක්ෂා කිරීම හා ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා කමිටුවක් පත් කර දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව කමිටු සාමාජිකයින් ලෙස ස්වේච්ඡාවෙන් පහක් හෝ හය දෙනෙක් ඉදිරිපත් වන ලෙස දන්වන ලදී.

1. උපසභාපති - **ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
2. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා
3. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා
4. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.වී.පී.එදිරිසූරිය මැතිතුමා

5. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ආර්.කේ.සුමනරත්න මැතිතුමා
6. ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

යන මන්ත්‍රීවරුන් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූ බවත්,ඒ අනුව 2025.11.19 වන දින පෙ.ව 9.00 සභාවට රැස්වී විෂය නිලධාරීගේ සමඟ ලිපිගොනු පරීක්ෂා කර ඔවුන්ගෙන් තොරතුරු විමසා වාර්තාවක් සකස් කර ඉදිරි මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටියහ.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025.11.19 දින කමිටුවක් මගින් ලිපිගොනු පරීක්ෂා කර නිලධාරි සමඟ සාකච්ඡාකර තීරණයක් ලබා ගැනිමට තීරණය විය.

xv. 2025.10.16 වන දින පැවති පුහුණු වැඩමුළුව සඳහා 2016.10.16 දින රු.15,480.00ක මුදලක් ලබා ගත් අතර එම අත්තිකාරම් මුදලට අමතරව රු.800.00ක මුදලක් අතින් වියදම් කිරීමට සිදුවිය. ( උදේ පැවති ගිණුම්ක්‍රම දේශනය සඳහා නිලධාරීන් 60 දෙනෙකු අපේක්ෂා කලත් 76 දෙනෙකු සහභාගි විය. එම නිසා 16 දෙනෙකුට රු.50 බැගින් රු.800.00 වේ) ඒ අනුව අතින් වියදම් වූ එම මුදල එල්.කේ.එස්.ගුණතිලක හට ගෙවීමටත්, එම රු.15,480.00 අත්තිකාරම් මුදල පියවීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවේ නිලධාරීන් හට කාර්යාක්ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කරගෙන සභාවේ පුහුණු වැඩමුළුවක් පැවැත්වූ අතර එහිදී අපේක්ෂිත නිලධාරීන් 60 ක් ඉක්මවා 76 ක් පැමිණි බැවින් එම අතින් වියදම් වල රු800.00 මුදල ගෙවීම ගැටළු සහගත නොවන බැවින් ගෙවීමට එම යෝජනාව අනුමත බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු800.00 මුදල ගෙවීමටත්,රු15,480.00 ක අත්තිකාරම් මුදල පියවීමටත් අනුමත කිරිම තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා ප.ව 1.35 ට සභාගර්භයෙන් ඉවත්ව යන ලදි.

xvi. ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමට පළාත් සභා ප්‍රතිපාදන යටතේ සපයා ගැනිමට යෝජිත බේල් යන්ත්‍රය සඳහා මිල ගණන් කැඳවිම සඳහා අනුමැතිය ලබා ගැනිම හා කමිටුව මගින් සකස් කරන ලද පිරිවිතර ද සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බේල් යන්ත්‍රය මිලදී ගැනීමට පළාත් සභාවෙන් වෙන්වී තිබුණ අතර අපගේ අවශ්‍යතාවයට අදාළ පිරිවිතර සකස් කිරීම සඳහා ටික කාලයක් ගත වූ බවත්,ඒ සම්බන්ධව පරිසර කමිටුව, පරිසර නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන් එක්ව මෙම පිරිවිතර සැකසූ බවත්, ඉංජිනේරු මහතාට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති බවත්,දැනට පවතින බේල් යන්ත්‍රය ප්‍රමාණවත් නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කළහ.කිසිවෙකුගෙන් විරෝධතාවයක් එල්ල නොවූ බැවින් මිලදී ගැනීම අනුමත කිරීම ලබාදීමට තීරණය විය.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

බෙල් යන්ත්‍රය සඳහා මිල ගණන් කැඳවීම සඳහාත්, කමිටුව මගින් සකස් කරන ලද පිරිවිතර අනුමත කිරීම තීරණය විය.

xvii. 2025.10.01 දින සිට 2025.10.31 දින දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදම් පිළිබඳ වාර්තාව සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.10.02 | 1094 | යුතාරා එන්ටප්‍රයිසස් | වීදි පහන් සහ විද්‍යුත් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 444,725.00 |
| | 1095 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය - ජුලි මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 16,330.00 |
| | 1096 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන පුස්තකාලය- අගෝස්තු මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 19,250.00 |
| | 1097 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය - අගෝස්තු මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 16,270.00 |
| 2025.10.03 | 1098 | එල්.එච්. චන්ද්‍රසේකර & බ්‍රදර්ස් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 1,020.00 |
| | 1099 | අශා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර ගැනීම වෙනුවෙන් ගෙවීම | 1,750.00 |
| | 1100 | පේපර් ලයින් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිඩට් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 36,083.00 |
| | 1101 | Kegall Distributors (pvt) Ltd | අදාහනාගාරය සඳහා ගෑස් 37.5 Kg සිලින්ඩර 06 සැපයීම වෙනුවෙන් ගෙවීම | 105,395.00 |
| | 1102 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 3,450.00 |
| | 1103 | භාෂිත ග්‍රැෆික් | බැනරයක් සවි කිරීම වෙනුවෙන් ගෙවීම | 1,320.00 |
| | 1104 | භාෂිත ග්‍රැෆික් | බැනරයක් සවි කිරීම වෙනුවෙන් ගෙවීම | 1,080.00 |
| | 1105 | සිතාරා ප්‍රින්ටස් | වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 2,015.00 |
| | 1106 | සිතාරා ප්‍රින්ටස් | පරිසර බලපත්‍ර මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 500.00 |
| | 1107 | ගුණවර්ධන සෙරමික් | රැස්වීම් ශාලාවේ අලුත් වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 36,575.00 |
| | 1108 | , ලංකා බැංකුව ,රඹුක්කන | ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම | 74,000,000.00 |
| 2025.10.08 | 1109 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025 සැප්තැම්බර් මස සභික දීමනා ගෙවීම | 570,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1110 | ජේ.සමන්ත | රාජ්‍ය කළමණාකරන සේවා නිලධාරී සංගමයේ 71 වන සම්මේලනයට සහභාගී විමට බස් රථයට ගෙවිම | 115,175.00 |
| 2025.10.09 | 1111 | ඩි. ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 4,888.88 |
| | 1112 | ඩී.පි.ජී. ආරියරත්න | අතිකාල දීමනා ගෙවීම | 3,589.25 |
| | 1113 | බී.පී.සිසිර | අතිකාල දීමනා ගෙවීම | 3,405.18 |
| | 1114 | බී.ඒ.අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,998.00 |
| | 1115 | අර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දීමනා ගෙවීම | 11,537.03 |
| | 1116 | එස්.ජේ.එස්. සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 21,543.33 |
| | 1117 | එච්.ඒ.සී.එල්. පියසේන | අතිකාල දීමනා ගෙවීම | 14,648.56 |
| | 1118 | එස්.සී.කේ.හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 14,957.75 |
| | 1119 | ඩබ්.ඩබ්. වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 16,854.00 |
| | 1120 | ඩබ්.ඩී.එස්. කේ. පියතිලක | අතිකාල දීමනා ගෙවීම | 8,329.00 |
| | 1121 | එස්.ඩබ්.සී.එස්. නන්දන | අතිකාල දීමනා ගෙවීම | 5,136.99 |
| | 1122 | එස්.තෙම්පලනි | අතිකාල දීමනා ගෙවීම | 2,092.44 |
| | 1123 | ජී.ජී.බී.ඒ. කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 7,100.74 |
| | 1124 | ජී.ඒ. බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,331.48 |
| | 1125 | පි.ගීත් ප්‍රේම ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 1,318.52 |
| | 1126 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 6,991.89 |
| | 1127 | ජේ.එන්.එල්.ජයසිංහ | අතිකාල දීමනා ගෙවීම | 6,210.74 |
| | 1128 | එච්. ඩබ්.ඒ.අයි.එල්. වීරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 6,059.25 |
| | 1129 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 2,444.44 |
| | 1130 | එස්.එන්.නන්ද ශ්‍රී | අතිකාල දීමනා ගෙවීම | 7,195.37 |

| | | | | |
|---|---|---|---|---|
| | 1131 | වී.ඒ.එස්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 1,363.33 |
| | 1132 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025 සැප්තැම්බර් මස අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතියට අදාළ කම්කරු වැටුප් ගෙවීම | 89,040.00 |
| | 1133 | ශ්‍රී ලංකා ඉන්ෂුවරනස් කෝපරේෂන් | JCB යන්ත්‍රයෙහි ගිනි රක්ෂණය,GG 2824 හොන්ඩා යතුරු පැදිය,Rw 2084 ටේලරය,Rw 9023 ටේලරය පූර්ණ රක්ෂණාවරණය සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 97,049.76 |
| | 1134 | එච්.ආර්.එන්.ටී. බණ්ඩාර | ගලි බවුසරය වෙන් කිරීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 7,675.00 |
| | 1135 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | පළාත් පාලන සතිය වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම | 100,000.00 |
| | 1136 | බී.ඒ.අසංක හංස කුමාර | ගමන් වියදම් ගෙවීම | 350.00 |
| | 1137 | ඩබ්.ඩබ්. වීරක්කොඩි | ගමන් වියදම් ගෙවීම | 2,250.00 |
| | 1138 | එස්.ජේ.එස්. සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 3,600.00 |
| | 1139 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ සැප්තැම්බර් මස දීමනා ගෙවීම | 63,300.00 |
| | 1140 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | සතිපොළ භූමියේ සෙල්ලම් මිදුලෙහි වැටෙහි ඉතිරි කොටස ඉදිකිරීම -10% රැඳවුම් මුදල් ගෙවීම | 48,332.68 |
| 2025.10.13 | 1141 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025.09.16 දින පවත්වන ලද සැලසුම් කමිටුව සඳහා සහභාගි වූ නිලධාරීන් සඳහා ගෙවීම | 18,000.00 |
| | 1142 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජී ප්‍රයිවට් ලිමිටඩ් | KMEN 04482 Canon ප්‍රින්ටරය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 18,172.00 |
| | 1143 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | ZA - 0191 JCB යන්ත්‍රයේ දුම් සහතිකය,ආදායම් බලපත්‍රය,යෝග්‍යතා සහතිකය,ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම | 10,790.00 |
| | 1144 | W.H.N.M. නවරත්න | SG - ZA 0108 බොබ් කැට් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 2,100.00 |
| | 1145 | යුනයිටඩ් මෝටස් ලංකා | PF -7429 ඩබල් කැබ් රථයේ පූර්ණ වාර සේවාව සිදු කිරීම | 73,006.54 |
| | 1146 | එච්.එම්.එන්.එම්.හේරත් | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 821.53 |

| | | | | |
|---|---|---|---|---|
| | 1147 | ඊ.එන්.ඩී.කුමාර | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 821.53 |
| | 1148 | එම්.ආර්.ඩී. සජික | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 589.25 |
| | 1149 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | 2025 අගෝස්තු ,සැප්තැම්බර් මාස වල පොදු වෙළඳපල ,ප්‍රාදේශීය සභාව, පෞද්ගලික බස් නැවතුම්පල යන ස්ථාන වල ජල බිල්පත ගෙවීම | 94,630.58 |
| | 1150 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | අගෝස්තු මස කාර්යාල දුරකථන බිල්පත ගෙවීම | 3,095.99 |
| | 1151 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 අගෝස්තු ,සැප්තැම්බර් මාස වල විදුලි බිල්පත් ගෙවීම | 39,716.31 |
| | 1152 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2025 අගෝස්තු මාසයට අදාළ ධාවනය වූ වාහන, තණ කොළ කපන මැෂින් සඳහා ඉන්ධන බිල්පත් ගෙවීම | 454,934.50 |
| 2025.10.15 | 1153 | ශ්‍රී ලංකා ඉන්ෂුවරනස් කෝපරේෂන් | ප්‍රාදේශිය සභා ගොඩනැඟිල්ල සඳහා 2025/2026 වර්ෂ සඳහා ගිනි රක්ෂණාවරණය සිදු කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 103,352.87 |
| | 1154 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025.07.17 ,2025.08.26 දින පැවති තාක්ෂණික ඇගයුම් කමිටුව සඳහා දීමනා ගෙවිම - (අධීක්ෂණ කටයුතු සඳහා ගෙවීම) | 1,500.00 |
| | 1155 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025.07.17 ,2025.08.26 දින පැවති තාක්ෂණික ඇගයුම් කමිටුව සඳහා තාක්ෂණික ඇගයුම් කමිටු දීමනා ගෙවිම | 21,000.00 |
| | 1156 | ඩබ්.අයි.සුභාෂණි | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 13,952.92 |
| | 1157 | ජී.එච්.ජ්.සී. සුමනරත්න | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 7,031.09 |
| | 1158 | ඩී.ඩී. ටී.කේ. අබේරත්න | අනතුරුදායක ගස් ඉවත් කිරීම - ගස් කැපුම්කරුට කුලිය ගෙවිම | 7,000.00 |
| | 1159 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025.10.16 දින කාර්යාල ක්‍රම ,ගිණුම් ක්‍රම පිළිබඳ පුහුණුව සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම | 15,480.00 |
| 2025.10.16 | 1160 | බී.ජී.එල්. විජේතුංග | සංවර්ධන නිලධාරි වෘත්තීය සංගමයේ වාර්ෂික සම්මේලනයට සහභාගී විමට බස් රථයට ගෙවිම | 121,775.00 |
| 2025.10.21 | 1161 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025.10.13 දින පවත්වන ලද සැලසුම් කමිටුව සඳහා දීමනාව ගෙවීම | 18,000.00 |
| | 1162 | ඩබ්.ජී.එල්. සුබසිංහ | අතිකාල දිමනා ගෙවීම | 2,996.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1163 | ජී.ආර්.වයි. සමන් කුමාරි | අතිකාල දිමනා ගෙවීම | 2,996.00 |
| | 1164 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දිමනා ගෙවීම | 4,085.11 |
| | 1165 | එම්.ජී.ඒ.කේ.මැදවත්ත | අතිකාල දිමනා ගෙවීම | 10,936.00 |
| | 1166 | එන්.ජී. අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දිමනා ගෙවීම | 7,453.28 |
| | 1167 | එම්.එන්. පද්මසිරි | අතිකාල දිමනා ගෙවීම | 7,407.40 |
| | 1168 | ඩබ්.ඒ. තිළිණ මධුසංක | ගමන් වියදම් ගෙවීම | 1,328.44 |
| | 1169 | ඩබ්.ඒ. තිළිණ මධුසංක | දේපල හිමිකම් විස්තර මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ලබා ගැනීම සඳහා අතින් වියදම් කළ මුදල් ලබා ගැනීම | 708.00 |
| | 1170 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම | 1,000.00 |
| | 1171 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 30,000.00 |
| | 1172 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 2025.09.01 -2025.09.31 දක්වා දුරකථන බිල්පත් ගෙවීම | 12,778.99 |
| | 1173 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 සැප්තැම්බර් මස තොග විදුලි බිල්පත් ගෙවීම | 69,172.00 |
| | 1174 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 ජුනි මස කාර්යාල නිලධාරීන් ලබා ගන්නා ලද දුම්රිය බලපත්‍ර ගාස්තු සඳහා ගෙවීම | 76,800.00 |
| | 1175 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 ජුලි මස කාර්යාල නිලධාරීන් ලබා ගන්නා ලද දුම්රිය බලපත්‍ර ගාස්තු සඳහා ගෙවීම | 8,400.00 |
| | 1176 | සභාපති ,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025 ඔක්තෝම්බර් මස සේවක වැටුප් ගෙවීම | 7,330,091.88 |
| 2025.10.27 | 1177 | එස්.ආර්.පී. එල්.සේනානායක | සතිපොළ භූමියේ වාහන නැවතුම්පලක් සඳහා කොටස් මැන වෙන් කර දීම වෙනුවෙන් මිනින්දෝරු ගාස්තු ගෙවීම | 30,000.00 |
| | 1178 | Indra Service Park ( Pvt) Ltd | LL -7614 අංක දරණ ෆෝටෝන් කැබ් රථය අලුත්වැඩියා කිරීම | 184,158.84 |
| | 1179 | නාමල් සර්විස් සෙන්ටර් | SG - RG 5925 ට්‍රැක්ටර් රථය හා ටේලරය පූර්ණ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 42,995.00 |
| | 1780 | නාමල් සර්විස් සෙන්ටර් | RD -7990 ට්‍රැක්ටර් රථය හා ටේලරය පූර්ණ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 34,070.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1181 | ඩබ්.ඒ.ආර්.එස්. විජේසූරිය | 251-2198 කැබ් රථයේ අලුත් වැඩියා කටයුතු සඳහා අතින් වියදම් කළ මුදල් ගෙවීම | 1,250.00 |
| | 1182 | ඒ.ඩබ්. ජයරත්න | පුස්තකාල විමර්ශන අංශයට පිවිසෙන දොරට අලුතින් යතුරක් කැපීම සඳහා අතින් වියදම් කළ මුදල ගෙවීම | 500.00 |
| | 1183 | කේ.ජී. ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 7,387.74 |
| | 1184 | රංජනි බේක් හවුස් | 2025.10.08 මහ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 4,897.00 |
| | 1185 | the Associated Newspapers of ceylon Limited | රඹුක්කන හඳගම මාර්ගය කොන්ක්‍රීට් කිරීම,කොම්පෝස්ට් අංගනයේ වැට සහ ගේට්ටුව අළුත් වැඩියා කිරීම සඳහා කොන්ක්‍රීට් ප්‍රදානය වෙනුවෙන් සිංහල ,දෙමළ භාෂා පුවත්පත් දැන්වීම් පල කිරීමේ ගාස්තු ගෙවීම | 76,464.00 |
| | 1186 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2024 ඔක්තෝම්බර් මස කාර්යාල නිලධාරීන් ලබා ගන්නා ලද දුම්රිය බලපත්‍ර සඳහා අදාළ ගාස්තු ගෙවීම | 25,425.00 |
| 2025.10.29 | 1187 | ආර්.එම්. එස්.එස්. බී. රත්නායක | ගමන් වියදම් දීමනාව ගෙවීම | 6,210.00 |
| | 1188 | ආර්.එම්. එස්.එස්. බී. රත්නායක | ගමන් වියදම් දීමනාව ගෙවීම | 3,450.00 |
| | 1189 | ආර්.එම්. එස්.එස්. බී. රත්නායක | ගමන් වියදම් දීමනාව ගෙවීම | 7,970.00 |
| | 1190 | කේ.ඩී.ඒ.ඒ. රණසිංහ | ගලි බවුසරය සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 7,815.00 |
| | 1191 | අයි.ඩී.ආර්.වී.ප්‍රියදර්ශන | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 679.40 |
| | 1192 | අර්.ජී.එස්.නිරෝෂන් | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 281.60 |
| | 1193 | ආර්.එම්.ජනක සංජීව | ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු මුදල් ආපසු ගෙවීම | 1,730.85 |
| | 1194 | පී.ඩබ්.සී. කුමාරසිංහ | 2025.10.15 දින සිට 2025.10.19 දින දක්වා සැණකෙළියක් සඳහා ගෙවන ලද මුදල් එම සැණකෙළිය නොපැවැත්වීම මත ආපසු ගෙවීම | 133,250.00 |
| | 1195 | එල්.ආර්.එන්.සඳරුවන් | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 794.63 |
| 2025.10.30 | 1996 | c-com equipment (pvt) Ltd | ZA -0108 අංක දරණ බොබ් කැට් යන්ත්‍රයේ අලුත් වැඩියාවක් සඳහා ගෙවීම | 382,414.06 |

| | | | | |
|---|---|---|---|---|
| | 1197 | ඇන්තනිස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිඩට් | දැලිවල සහ රඹුක්කන පෙර පාසල් වල තීන්ත ආලේප කිරිම සඳහා අවශ්‍ය තීන්ත සැපයිම වෙනුවෙන් ගෙවීම | 55,017.00 |
| | 1198 | එස්.එම්.කේ.බී. සමරකෝන් | තණකොළ කපන මැෂින් තල සැපයිම වෙනුවෙන් ගෙවීම | 1,150.00 |
| | 1199 | යුතාරා එන්ටප්‍රයිසස් | කාර්යාලය ඉදිරිපිට තීන්ත ආලේප කිරිමට අවශ්‍ය ටිනර් සැපයිම වෙනුවෙන් ගෙවීම | 975.00 |
| | 1200 | තිලක් එන්ටප්‍රයිසස් & ටී.ඉ. ඉලෙක්ට්‍රිකල් | දුරස්ථ පාලක මඟින් ක්‍රියාකරන විදුලි සිනු 02 සැපයිම වෙනුවෙන් ගෙවීම | 4,590.00 |
| | 1201 | ඒ.කේ.ඩබ්.පුෂ්ප කුමාර | අදාහනාගාරය සඳහා ලාෆ් ගෑස් 37.5 Kg සිලින්ඩර 05 සැපයිම වෙනුවෙන් ගෙවීම | 87,825.00 |
| | 1202 | Kegall Distributots (pvt) Ltd | අදාහනාගාරය සඳහා ,ලිට්රෝ ගෑස් 37.5 Kg සිලින්ඩර 05 සැපයිම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1203 | එම්.බී.එම්.සැෆ්රන් | පොල් පොහොර සහ ඩොලමයිට් සැපයිම වෙනුවෙන් ගෙවීම | 2,354.00 |
| | 1204 | භාෂිත ගැෆික් | මහ සභා න්‍යාය පත්‍ර ඇමුණුම් මුද්‍රණ කර සැපයිම වෙනුවෙන් ගෙවීම | 3,135.00 |
| | 1205 | භාෂිත ගැෆික් | මහ සභාව වෙත ලබා දීම සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ මුද්‍රණ කර සැපයිම වෙනුවෙන් ගෙවීම | 2,380.00 |
| | 1206 | භාෂිත ගැෆික් | සභා වාර්තා මුද්‍රණය කර සැපයිම වෙනුවෙන් ගෙවීම | 8,277.50 |
| | 1207 | සුරම්‍යා සෙරමික් | දැලිවල සහ රඹුක්කන පෙර පාසල් වල තීන්ත ආලේප කිරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 54,575.00 |
| | 1208 | සුරම්‍යා සෙරමික් | කාර්යාලය ඉදිරිපිට තීන්ත ආලේප කිරිමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 6,270.00 |
| | 1209 | බී.ඒ. අසංක හංස කුමාර | අතිකාල දිමනා ගෙවීම | 3,332.59 |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සංවර්ධන නිලධාරින් ඔවුන්ගේ වෘත්තිය සමිතියට සහභාගී වීම සඳහා දුම්රිය වොරන්ට් එකක් ලබාගෙන ඇති බවත්,ඒ සඳහා බස් රථයට මුදල් ගෙවා ඇති බවත් සම්මේලනය 10/24 දින පැවැති බවත්, කලින් මුදල් ගෙවා ඇති බවත්,එසේ සිදු කළ කළ හැකිද? මූල්‍ය අවභාවිතයක් සිදුවී ඇති බවත්,ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නිලධාරීන්ට රේල් වේ වොරන්ට් හිමි අතර වෘත්තීය සමිතිවල කටයුතු සඳහා නිවාඩු ලබා ගැනීම ඔවුන්ගේ සේවාව අවශ්‍යතාවයක් වන බවත්,රේල් වේ වොරන්ට් ලබාගෙන එම මුදලින් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම ඔවුන්ට හිමි වරප්‍රසාදයක් බවත්,ඔවුන්ට එම ගමන යාමට නොහැකි වූවා නම් එම් මුදල නැවත ප්‍රතිපූර්ණය කළ යුතු බවත් ප්‍රශ්න ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වොරන්ට් දෙනවා නම් අපි මුදල් ගෙවිය යුතු නැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.පී.දසනායක මැතිතුමා**

රාජ්‍ය සේවකයින්ට හිමි වොරන්ට් පහසුකම දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගමන යාමට ප්‍රථම නිකුත් කළ ද ගමන ගිය පසු තම දෙපාර්තමේන්තුව විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත එම මුදල ගෙවිය යුතු බව ප්‍රකාශ කරන ලදී. මෙලෙස ලිපි ලේඛණන හොඳින් අධ්‍යනය කර සභාවට ඉදිරිපත් කළානම් ඒ කාලයෙත් විපක්ෂ මන්ත්‍රීවරුන්,ඉතා අගය කරන බවත් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.10.01 දින සිට 2025.10.31 දින දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

**(ඊ).02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

i. අලගල්ල ගල නැරඹීමට පැමිණෙන ජනතාවගෙන් ප්‍රදේශවාසීන්ට මහත් අසිරුතාවයට පත්වන බැවින් ඒ නිසා උදෑසන 7 සිට සවස 5 දක්වා කාලය සීමා කිරීමට අදාල ආයතන දැනුවත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ද,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදී හිතවතුන්ගෙන්ද අවසරයි.මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට මුල් මුල්ම හේතුව වූයේ අලගල්ල ගල නැරඹීමට පැමිණෙන සංචාරකයින් අවස්ථා කීහිපයකදීම අනතුරු වලට භාජනය වී ඇති බවත් රාත්‍රී කාලයේදී සංචාරයකින් එහි රැඳී සිටිමින් මත්ද්‍රව්‍ය භාවිතා කරන බවත්, ප්‍රදේශවාසීන් මහත් අපහසුතාවයන්ට මුහුණ දෙන නිසා රාත්‍රී කාලයේ නැරඹීමට යම් පුද්ගලයකු සම්බන්ධ වනවානම් ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුත්තක් සභාවක් විදිහට අප හෝ මැදිහත් වී සිදුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ද,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදී හිතවතුන්ගෙන්ද අවසරයි.මෙසේ වේලාවක් වෙන් කළහොත් සංචාරක ආකර්ෂණයක් පවතින ස්ථානයක් අපට අහිමිවන බවත්, එසේ වීමට හේතුව ලෙස කන්ද නැගීමටත් බැසීමටත් පමණක් මෙසේ කාලය තීරණය කිරීමෙන් සිදුවන බවත්, පරිසරයේ සිරි නැරඹීමට( ඉර බැස යාම වැනි ) අවස්ථාවක් හිමි නොවන හෙයින් මේ යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

අනුර මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට යම් දෙයක් එක් කිරීමට අදහස් කරන බවත්, ඒ අනුව කාලය සීමා කරනවාට වඩා යම් ක්‍රමවේදයක් සකස් කරනවා නම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සංචාරක ව්‍යාපෘති හරහා තමයි අපේ රටේ ආර්ථිකයට විශාල මුදල් ප්‍රමාණයක් එක් වව බවත්, අපි සභාවක් හැටියට තීරණ ගන්නවා වඩා පොලිස් ස්ථානය, සංචාරක ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි ආයතන හා එක්ව මෙහි කාලසීමාව තීරණය කරනවාද? යන්න පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බවත් මෙම යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට කැමති බවත්, ඒ අනුව සංචාරක පොලිසි ස්ථානයක් එතැනට ස්ථාපිත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි රටක් විදිහට එකට එක්ව වැඩ කටයුතු කෙරේ කිරීම වඩාත් සුදුසු බවත්,සංචාරක ව්‍යාපාර සම්බන්ධ වැඩසටහනක් පවතින අතර එයට රුක්මන් මන්ත්‍රීතුමාව සම්බන්ධ කරගෙන මේ සඳහා සාර්ථක විසඳුමක් ලබා දීමට කටයුතු කරමු.එතෙක් සංචාරක පොලීසියක් දැමීම, පාර දෙපසින් බැම්මක් ඉදිකිරීම වැනි දේ සිදුකරමින් තියෙන දියුණු සංචාරක කලාපයක් බවට පත් කරමුයි ප්‍රකාශ කරමින් එම යෝජනාව දිගුවකට යොමු කරන ලදී.

තීරණය -

01.ඒ අනුව සංචාරක ක්ෂේත්‍රයට අදාළ ආයතන සියල්ලෙහි සහභාගිත්වයෙන් යුත් මණ්ඩලයක් මඟින් වේලාව සම්බන්ධව තීන්දුවක් ගැනිමට තීරණය විය.

02.සංචාරක පොලීසියක් දැමීම, පාර දෙපසින් බැම්මක් ඉදිකිරීම යන යෝජනා දෙක ක්‍රියාත්මක කිරිමට තිරණය විය.

ii. බැද්දවල වත්ත මාර්ගය සංවර්ධන කටයුතු වලදී රිවර්ඩ් පිරිස් වතු සමාගමෙන් 50% ක මුදලක් ලබා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.කෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

බැද්දවලවත්ත මාර්ගය ඉහතදී සඳහන් කළ පරිදි සංවර්ධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව අලගල්ල සංචාරක කලාපයට වැදගත් බවක් හිමිවන බවත්, ලක්ෂ 15 ක් පමණ වියදම් කර රිවර්ඩ් පිරිස් වතු සමාගම විසින් බැම්මක් ඉදිකර ඇති බවත්, වර්ෂාවා සමඟ එම බැම්ම කඩා වැඩි වැටී ඇති බවත්,ඔවුන් විශාල වශයෙන් රබර් ගස් වල කොට ප්‍රවාහනය කිරීම නිසාත්, මෙම මාර්ගය අඩි 12 කට සංවර්ධනය කිරීම සුදුසු බවත්, ඒ සඳහා යන වියදම කාර්මික නිලධාරී මඟින් තක්සේරු කර එම වටිනාකමින් අඩක් එම සමාගමෙන් අය කරගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හොඳ යෝජනාවක් බවත්, හිටපු මාර්ග සංවර්ධන ආධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ අනුදැනුම මත කැඩී ගිය කොටසෙහි පැති බැම්ම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කළ බවත්, එහි අගය රු17,80,000.00 ක් බවත් වතු සමාගමත් සමඟ එක්ව මෙම මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කිරීම සුදුසු අතර මෙම යෝජනා ක්‍රියාවට නැංවීමට තීරණය විය.

අදාළ යෝජනාව සභා සම්මත විය.

තීරණය -

වතු සමාගමත් සමඟ එක්ව මෙම මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

iii. ගංගොඩ මාකඩවල මාර්ගයේ කාණු පිටාර ගැලිමෙන් පහල ගෙවල් වලට ජලය ගැලීම නිසා පීඩාවට පත්වේ. එබැවින් කාණු ඉදිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අධික වර්ෂාවත් සමඟ මාර්ගය දිගේ ජලය ගලාගෙන යන බවත්, පවතින කාණු පද්ධතිය ප්‍රමාණවත් නොවන බවත්, කාණු උතුරා දෙපස පිහිටි නිවාස වලට බලපෑම් එල්ල වන බවත්, එම නිසා කාණු පද්ධතිය ඉදි කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සංවර්ධන ව්‍යාපෘති ප්‍රජාපාදක සංවිධාන හරහා කිරීම සුදුසු බවත්, මහජනතාවගේ අනුමැතිය ලබාගෙන එම කොටස සංවර්ධනය කිරීම මඟින් ගැටුම් ඇති නොවන බවත්, මාර්ග සංවර්ධනය කිරීමේ දී කාණු පද්ධතියක් සමග සංවර්ධනය කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යෝජනාව භාර ගන්නා බවත්, හැකි ඉක්මනින් පිලිසකර කිරීම් සිදුකර මහජනතාවට සහයෝගය ලබාදීමට කටයුතු කිරීමට තීරණය විය.

අදාළ යෝජනාව සභා සම්මත විය.

තීරණය -

හැකි ඉක්මනින් කාණු පද්ධතිය සකස් පිලිසකර කිරීම් සිදු කිරිමට තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

i. දියසුන්නත බෝධිරාජ ළමා නිවාසය හා රඹුක්කන වැඩිහිටි නිවාසය සඳහා ඉදිරි කාලයන් සඳහා ගලි සේවාව සම්පූර්ණයෙන් නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.ටී.නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

අධික වාර්ෂාවත් සමඟ බෝධිරාජ ළමා නිවාසයේ වැසිකිළි වලවල් උතුරා පිඩාවට පත් වූ බවත්,ප්‍රජා සත්කාරයක් ලෙස වෙන ගලිසේවාව ළමා නිවාසයට හා වැඩිහිටි නිවාසයට ලබාදීම සභාව විසින් තීරණයක් ගැනීම සුදුසු බවත්, පනතේ සඳහන් වන පරිදි උපතේ සිට මරණය දක්වා මහජනතාවට සේවය සැපයීම අපගේ කර්තව්‍ය වන බවත්, ඒ නිසා මෙම යෝජනාවට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටියහ.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යෝජනාව හොඳ බවත්, නීතිමය ගැටලුවක් පවතින බවත්, කිසිම සේවාවක් නොමිලේ සපයා නොදෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමිගෙන් යෝජනාවක් පවතින බවත්, කෙසේ වෙතත් එම සේවාව ලබාදීමට ප්‍රථම එහි පරිපාලනය පිළිබඳව හොඳ අධ්‍යයනයක් කළ යුතු බවත්, බොහෝ විට මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය හෝ රාජ්‍ය නොවන සංවිධාන වල අනුග්‍රහය ලැබෙන බවත් තවදුරටත් ඒ පිළිබඳව විමර්ශනය කර තොරතුරු ලබාගෙන තීරණයකට යාම සුදුසු බවත්,විගණනයට ලක් වන නිසා සම්පත් දායකයින් කිහිප දෙනෙකුට මේ වගේ අවස්ථාවකට උදව් කිරීමට යොමු කිරීම සුදුසු බවත්, ප්‍රකාශ කරමින් යෝජනාව දිගුවකට යොමු කරන ලදී.

තීරණය -

විගණනයට ලක් වන නිසා සම්පත් දායකයින් කිහිප දෙනෙකුට මේ සඳහා අවස්ථාව ලබා දිමට තීරණය විය.

ii. පින්නවල ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිරිපිට ඇති බස් නැවතුම්පල අබලන් වී ඇති බැවින් අදාල ආයතන දැනුවත් කිරීම හා සංවර්ධනය කිරිම සුදුසු බවට යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සංචාර කලාපයක පවතින මෙම බස් නැවතුම්පල අබලන්ව ඉතා අවලස්සන ස්වභාවයක් ගන්නා බවත්, වර්ෂාව පවතින අවස්ථා වලදී මෝටර් සයිකල්වල ගමන් කරන පුද්ගලයින්ට රැඳී සිටීමටත් සුදුසු පරිදි නවීකරණය කිරීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

යෝජනාව අගය කරන බවත්, ඒ සම්බන්ධව මුදල් ප්‍රතිපාදන පළාත් සභාවෙන් වෙන් වී ඇති බවත්, ඉදිරි වර්ෂයේදී අධිවේගී පිවිසුම විවෘත වීමත් සමග කරඬුපන සිට රඹුක්කන දක්වා වූ මාර්ග මංතීරු 03 ට පුළුල් කිරීමට යෝජිත බවත්, පවතින ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සංචාරක පුරවරයක පවතින බැවින් අලුත්වැඩියාවක් හෝ සිදුකර සංචාරක ආකර්ෂණයට හිතකර තත්ත්වයක් ඇතිකිරීමට කටයුතු කිරීම සුදුසු බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම මාර්ගයේ පවතින බස් නැවතුම්පොළවල් කිහිපයක් අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය විය.

iii. කිරිවල්ලාපිටිය ආදාහනාගාරයට පැමිණෙන වාහන නවතා තැබීම සඳහා රථගාලක් සෑදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ස්ථිර කරනලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ආදාහනාගාරය සෑම දිනකම වාගේ භාවිතා වන බවත්.ඒ ඉදිරිපස විශාල මඩ වලක් පවතින බැවින් සෑම විටකදීම වාහන බොහෝ ප්‍රමාණයක් පැමිණෙන බවත්,එම වාහන පාර දෙපස නවතා තබන නිසා මාර්ගය භාවිතා කරන මහජනතාව ඉතා අපහසුතාවයට පත්වන බවත්,ආදාහනාගාරය භාවිතා කරන අය හට සේවාවක් සැපයීම ලෙස සලකා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ද,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදී හිතවතුන්ගෙන්ද අවසරයි.මෙවර අයවැය යෝජනා මත මේ පිළිබඳව සඳහන් වන බවත්, එහිදී පාලර් එකක් ඉදිකිරීමට යෝජනා වී ඇති බවත් ප්‍රකාශ කළ අතර එයට ප්‍රධානතම හේතුව ලෙස හමුදා, පොලිසිය වැනි ආරක්ෂක අංශයේ පෙරට්ටුව පැවැත්වීමට සුදුසු ස්ථානයක් නොමැති වීම හා එමඟින් ද මාර්ග තදබදයක් හටගන්නා බවද එතුමා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පාලර් එකක් නිර්මාණය කිරීම සම්බන්ධව තවදුරටත් අධ්‍යයනය කිරීම සුදුසු බවත්,රඹුක්කන නගරයේ පෞද්ගලික ආයතන දෙකක පාලර් පවතින බැවින් තරඟකාරීත්වයක් ඇතිවිය හැකි බවත්, තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එමඟින් දීර්ඝ කාලීනව මෙවැන්නක් ඉදිකිරීම සුදුසු යැයි සිතා බලන ලෙසත්, (බහුතරය සිටින බැවින් යෝජනාව ඒකමතිකව සම්මත වන බැවින්නුත්)ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඕනෑම යෝජනා හිතුමතේ ක්‍රියාවට නංවන්නේ නැති බවත්, සෑම යෝජනාවක්ම සක්‍යතා අධ්‍යයනයක් සිදු කරන බවත්, ඒ අනුව එම යෝජනාව සම්බන්ධව සක්‍යතාවයක් සිදුකරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රථ වාහන නැවැත් වීමට සුදුසු පරිදි සකස් කිරීමට තීරණය විය.

iv. බතඹුරය මහීපාල හේරත් ක්‍රීඩාංගනයට හා අශෝක කරුණාරත්න ක්‍රීඩාංගනය සඳහා ක්‍රිකට් ක්‍රීඩාවේ නියුතු තණතීරුව ආවරණය කිරීම සඳහා වැසි ආවරණ මිලදී ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම ක්‍රීඩාංගන දෙකෙහිම නිරන්තරයෙන් ක්‍රිකට් තරග පවතින බවත්,වැසි කාලයෙදී මෙම වැසි ආවරණ යොදා ගැනීම මඟින් ක්‍රිඩාව සාර්ථකව සිදුකර ගැනීමට හැකිවන බවත්, තවද මෙම තණ තීරුව නැවත සකස් කිරීමට හැකියාවක් ඇත්නම් එය වඩා සුදුසු බවත්, දැඩි පන්දු ක්‍රීඩා කිරීමට ස්වභාවික ක්‍රීඩාංගනයක් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නොමැති බවත්,මේ

සම්බන්ධව තාක්ෂණික දැනුම මෙන්ම මූල්‍ය ප්‍රතිපාදන වුවත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දිය හැකි බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමා මැදිහත් වී සිදුකර ඒ සම්බන්ධව තාක්ෂණික දැනුම හා ප්‍රතිපාදන ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත්,පළාත් සභාවෙන් ද ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබාදීමට ද තීරණය කර ඇති බවද ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

තාක්ෂණික දැනුම හා ප්‍රතිපාදන ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

v. දැනට ස්ථාපනය කර ඇති වීදි පහන් සියල්ල අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ආසනය පුරා පවතින වීදි පහන් ප්‍රමාණය කොතෙක්ද යන්න පවා ප්‍රකාශ කළ නොහැකි තරම් බවත්, පවතින විදුලි පහන් ඉවත් කිරීමට කටයුතු සිදුවෙමින් පවතින බව මහජනතාව තමා දැනුවත් කරන බවත්, එසේ සිදු නොකර තිබෙන වීදි පහන් අලුත්වැඩියා කර පවත්වාගෙන යාම සුදුසු බවත්, හැකිනම් නව විදුලි පහන් ස්ථාපිත කිරීම මහජන සේවාවක් ලෙස අගනා කාර්යක් බවත්,ඒ සඳහා දැරීමට වන වියදම් අපගේ ආයෝජනයක් බවත්, තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

විශේෂයෙන්ම නගරය අඳුරේ තැබීම සුදුසු නැති බවත්,රාත්‍රිය මෙන්ම හිමිදිරි උදෑසන මහත් මහජනතාව තම රාජකාරිය සඳහා විශේෂයෙන්ම දුම්රිය භාවිතයට ගන්නා ගන්නා බැවින් ඒ සඳහා යාමට ඒමට නගරයේ පැවතිය යුතු අවශ්‍යතාවයක් වන විදුලි බල්බ සකස් කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ද,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදී හිතවතුන්ගෙන්ද අවසරයි.විශේෂයෙන්ම මහජනතාවගේ වරිපනම් අය කරන ඔවුන්ගේ සුභසාධන කටයුත්තක් වන විදි පහන් ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමාට ගරු කරනවා.මහජනතාවගේ හද ගැස්ම ගැන තේරුම් ගැනීම සම්බන්ධව, නමුත් මෙම වර්ෂයට අදාළ ප්‍රතිපාදන අවසන් බවත්,ඉදිරි වර්ෂයේදී කොට්ඨාශ මට්ටමින් අවශ්‍ය අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉදිරි වර්ෂයේදී කොට්ඨාශ මට්ටමින් අවශ්‍ය අවශ්‍යතාව සපුරාලීමට කටයුතු කිරීමට තීරණය විය.

vi. පදවිගම්පල යකුල්ල ප්‍රදේශයට හා දඹුලු කොලනිය සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතියක් කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය විසින් ස්ථිරි කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පදවිගම්පල, යකුල්ල ප්‍රදේශයට හා දඹුලු කොළණිය ප්‍රදේශයට වර්ෂාව නොමැති කාල වලදී ජලය ලබා ගැනීම ඉතා දුෂ්කර බවත්,1976,1980 වැනි කාල වලදී ඉදිකළ පොදු ළිං කිහිපයක් පවතින බවත්,ඒවා සංවර්ධනය කර ප්‍රජාමූල ජල ව්‍යාපෘතියක්

ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්,දඹුලු කොළනිය කන්ද මුදුනේ පවතින ප්‍රජා ජල ව්‍යාපෘතිය සක්‍රීය තත්ත්වයට ගැනීමත් යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දඹුලු කොළනිය ප්‍රජා ජල ව්‍යාපෘතිය සම්බන්ධව ගාමිණී මන්ත්‍රීතුමා සමඟ එතුමා සහභාගී වී නිරීක්ෂණය කළ බවත්,සමීර මන්ත්‍රීතුමා හා ගාමිණී මන්ත්‍රීතුමන් දෙදෙනා එක්ව ව්‍යාපෘතියක් සකස් කරන ලෙසත්, බාහිර පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන්ද සහාය ලබාදීමටද කටයුතු සිදුකරන බවත්, එම යෝජනාව සාධනීය යෝජනාවක් බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

සමීර මන්ත්‍රීතුමා හා ගාමිණී මන්ත්‍රීතුමන් දෙදෙනා එක්ව ව්‍යාපෘතියක් සකස් කිරිමටත්,බාහිර පුද්ගලයින්ගෙන් සහය ලබා ගෙන ගැනිමටත් තීරණය විය.

vii. දොඹේමඩ හා කටුපිටිය මාර්ග මූලික කරගනිමින් ජල යෝජනා ක්‍රමයක් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ජලය ලබාදීම සම්බන්ධව අපට තීන්දු තීරණ ගැනීමට නොහැකි බවත්, ඒ සම්බන්ධව කටයුතු කිරීමට ජල හා ජලා පවාහන මණ්ඩලය සිටින බවත්,මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු නොවන බවත්, විෂය හා විෂය ඒකක ගැන අවබෝධයකින් කටයුතු කර යුතු බවත් ප්‍රකාශ කර සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපගේ විෂය පථයට සම්බන්ධව කටයුතු කළ යුතු බව දන්නා නමුත් මහජනතාවගේ ප්‍රශ්නයක් බැවින් ඒ සම්බන්ධව අපට කල හැකි දෙයක් තිබේනම් එයා අප විසින් ඉටු කරලීම හෝ අදාළ පාර්ශවය දැනුවත් කිරීම අපගේ යුතුකමක් බැවින් මෙම යෝජනාව ගෙනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සභාවක් විදිහට අපට හැකියාවක් පවතිනවා ප්‍රජා ජල ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමට එසේ නොහැකි නම් අදාළ ආයතන වලට දැනුම් දී එම ප්‍රදේශයට ජලය ලබාදීමට කටයුතු කිරීමට හැකියාව පවතී නම් එය ඉතා අගය කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රජා ජල ව්‍යාපෘතියකට යාමට හැකියාවක් පවතී නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමටත්,එසේ නොහැකි නම් අදාළ ආයතන දැනුවත් කර ජලය ලබාදීමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ප්‍රජා ජල ව්‍යාපෘතියකට යාමට හැකියාවක් පවතී නම් අවශ්‍ය කටයුතු සිදු කිරිමත්,එසේ නොහැකි නම් අදාළ ආයතන දැනවත් කිරිමට තීරණය විය.

viii. පහත මාර්ල වල කඩතොලු වී ඇති කොටස් තාර යොදා සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

➢ දැලිවල සිට ගොඩගම්පල හරහා පදවිගම්පල දක්වා මාර්ගය - චිප් ගල් යොදා සංවර්ධනය කිරීමටත්

- වැලිගමුව පාසල් මාවත - කඩතොළු වී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම
- දියසුන්නත වොලිබෝල් ක්‍රීඩා පිටිය අසලින් ආරම්භ වී අශෝක මහා විද්‍යාලය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම - සංවර්ධනය කිරීමට
- සිල්ලුගල සිට කහගොල්ලාවල දක්වා මාර්ගය - කඩතොළු වී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම
- උඩගලදෙනිය වල්ගම වැතැන්න මාර්ගය - කඩතොළු වී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම
- උඩගලදෙනිය මැදගලදෙනිය මාර්ගය - කඩතොළු වී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම
- මුවපිටිය පන්සල අසලින් කපුරුකඩේ හන්දිය දක්වා මාර්ගයේ මීටර් 500 ක් පමණ සංවර්ධනය නොවූ කොටස සංවර්ධනය කිරීම - කඩතොළු වී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම

මෙම මාර්ග සියල්ලම තාර යොදා අපගේ ශ්‍රමදායක්වත් යොදාගෙන සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී. මීටර 500 ක් පමණ සංවර්ධනය නොවූ ප්‍රමාණයක් සංවර්ධනය කිරීමටත්,කොන්ක්‍රීට් යොදා සකස් කර ඇති ප්‍රමාණයෙහි කඩතොලු වී ඇති ස්ථාන තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

- **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

අවසාන යෝජනාව හා සම්බන්ධව මා විසින් යෝජනාවක් මීට පෙර ඉදිරිපත් කර තිබෙන බවත්, කොන්ක්‍රීට් පාරකට තාර දැමුව හොත් එය මෝඩ ක්‍රියාවක් බවත්,කඩතොලු වලට තාර අතුරා චිප් ගල් යොදා සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

තාර යොදා සංවර්ධනය කරනවා යන්නෙන් අදහස් කරන්නේ තාර සීට් දැමීම නොවන බවත්, කඩතොළු සුද්ද කර එම වලට තාර වත්කර ඊට උඩින් චිප් ගල් යොදා සකස් කිරීම බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති තුන්වෙනි යෝජනාව වන දියසුන්නත අශෝක මහ විද්‍යාලය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කර තිබුණද එම කොන්ක්‍රීට් එක සම්පූර්ණයෙන්ම වාගේ ගැලවී විනාශ වී ඇති බවත්,එම මාර්ගය අලුත් වැඩියා කිරීම පලක් නොමැති බවත්, අලුතින්ම කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය තත්ත්වයකට පත්ව ඇති බවත්,2026 අයවැය යෝජනා අතර කොට්ඨාශ මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතිය යටතට මෙම මාර්ගය ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.ගම්වාසීන් විසින් මෙම මාර්ගයට පස් දමා තාවකාලිකව ගමනාගමන පහසු කර ගැනීමට පාර සකසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය**

සමීර මන්ත්‍රීතුමා දෙවැනියට ඉදිරිපත් කළ මාර්ගය වන වැලිගමුව පාසල් මාවත සඳහා මෙම වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් වෙලා තිබුණ බවත්, ගැටලු කිහිපයක් නිසා එම සංවර්ධන ව්‍යාපෘතිය සිදුකිරීමට නොහැකි වූ බවත්, දැනට කාර්මික නිලධාරි මහත්මයා සහ ඉංජිනේරු මහතා අධීක්ෂණය කර වාර්තා සකස් කරමින් පවතින බවත්, 2026 අයවැය යෝජනාව යටතේ මෙම මාර්ගය ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මම පෞද්ගලිකව මෙම මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බව දැන්වූයේ මහජනතාව මා දැනුවත් කර තිබූ නිසා බවත්, මෙම යෝජනාව 2026 සංවර්ධන යෝජනා වලට ඒ ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශයට පත් වූ නිසා මා බෙහෙවින්ම සතුටට පත්වන බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ඇත්තේන්ම මෙම මාර්ග සංවර්ධනය වනවා නම් ඉතා වටිනා බවත්,විශේෂයෙන්ම මුවපිටිය කපුරු කඩේ මාර්ගයේ ප්‍රජාශාලාව තෙක් රුපියල් ලක්ෂ පහළොවක් වියදම් කර කොන්ක්‍රීට් කර ඇති අතර ඉතිරි ප්‍රමාණය සංවර්ධනය කිරීම සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රඹුක්කන ආසනයේ සෑම පාරක් වගේම ගමනාගමනය සිදුකිරීමට තරම් සුදුසු තත්ත්වයේ නොමැති අතර බහුතරයක් අබලන් තත්ත්වයේ පවතින බවත්, පසුගිය මාස 06 ඇතුළත අපි තුන් අවුරුදු සැලැස්මක් සකස් කළ බවත්,එය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බවත්,හෙට දවසේ මෙම මාර්ගය සංවර්ධනය නොවුනත් ඉදිරි වසර දෙකක කාලය ඇතුළත සිදුවීමට නියමිත බවත්,යෝජනාව ක්‍රියාවට නැංවෙමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

තුන් අවුරුදු සැලැස්මට අන්තර්ගතව ඇති බැවින් ඉදිරි වසර දෙකක කාලය තුළ සංවර්ධන කිරිමට තීරණය විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

i. නාමල්ගමුව ජනවසම සිට ජලය සැපයූ ජලනල පද්ධතිය අලුත්වැඩියා කර නාමල්ගමුව ගම්වාසීන්ට පානිය ජලය ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ද,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද මාධ්‍යවේදී හිතවතුන්ගෙන්ද අවසරයි. 2012 වර්ෂයේ දී නාමල්ගමුව ජන වසමේ පානීය ජලය ලබා ගැනීම සඳහා ජල ටැංකි දෙකක් ඉදිකර තිබෙන බවත්,ඒ සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතියක් මගින් ජලය ලබා දී තිබෙන බවත්, ප්‍රකාශ කරන ලදී.සතුන්ගෙන් හා මිනිස් ක්‍රියාකාරකම් මගින් එහි බට විනාශයට පත්ව ඇති බවත්,එම ප්‍රදේශයේ ජනතාවට නැවත එම ප්‍රජා මූල ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර දෙනවා නම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රජා ජල ව්‍යාපෘතියට සම්බන්ධ එම ප්‍රජා සංවිධානය සක්‍රීය කිරීමට කටයුතු කරන ලෙසත්, ඉන්පසුව ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

ප්‍රජා ජල ව්‍යාපෘතියට සම්බන්ධ එම ප්‍රජා සංවිධානය සක්‍රීය කිරීමෙන් අනතුරුව ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට තීරණය විය.

ii. සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ කාර්ය යටතේ වැසිකිලි පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිලියක් සාදා ගැනිමට ආධාරයක් ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

අඩු ආදායම් ලාභී පවුල්වල සාමාජිකයින් විවාහ වී නිවසින් වෙන්ව ගියත් ප්‍රධාන මව් නිවසෙහි පවතින වැසිකිලියම භාවිතා කරන තත්ත්වයක් නාමල්ගමුව ජනවසමෙහි දක්නට ලැබෙන බවත්, වත්තේගෙදර කරුණාවතී මැතිනියත් සමග එක්ව මම

මේ සම්බන්ධව තොරතුරු රැස්කළ බවත්,අඩු ආදායම්ලාභී පවුල්වල වැසිකිලි පද්ධතියක් නොමැති නිවාස සඳහා වැසිකිලි සකස් කර ගැනීම සඳහා ආධාර මුදල් ලබාදීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව ඉතා දීර්ඝ ක්‍රියාවලියකට යා යුත්තක් බවත්,එම වැසිකිලි අවශ්‍යතාවය පවතින පවුල්වල පුද්ගලයින්ට පෞද්ගලික ඉල්ලීම් සිදු කරන ලෙසත්, සභාවක් හැටියට අපට මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට හැකියාවක් පැවතුන විට ඒ සම්බන්ධ කටයුතු කිරීමට අවශ්‍යය කටයුතු සිදු කරමු යැයි ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

වැසිකිලි අවශ්‍යතාවය පවතින පවුල්වල පුද්ගලයින්ට පෞද්ගලික ඉල්ලීම් කිරිම තීරණය විය.

**(ඊ).05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ජී.මල්ලිකා මැතිතුමිය**

i. පුවක්මොටේ වසමේ ප්‍රාදේශිය සභාවට අයත් ඉහලගම මාර්ගය තද වර්ෂාව නිසා වලවල් සෑදී ඇත. එම වලවල්වලට බොරළු පස් දමා සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.ජී.මල්ලිකා මැතිතුමිය**

මෙම පන්සල් පාර ගම්පෙරළිය, කඳුරට දසකය වැනි වැඩ සටහන් වලින් ලක්ෂ 40 ක් පමණ වියදම් කර පැති බැම් ඉදිකර ඇති බවත්,නමුත් මාර්ගය වාහන ගමනාගමනයට සුදුසු තත්ත්වයක නොමැති අතර කොන්ක්‍රීට් දමා සකස් කිරීම සුදුසු බවත්,ප්‍රතිපාදන නොමැති බැවින් එම වලවල් බොරළු පස් යොදා හෝ සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

තවද මෙම යෝජනාව 2026 සංවර්ධන යෝජනා වලටද යෝජනා කළද එහි එය නොමැති බවත්,සපු කන්ද මාර්ගය සංවර්ධනය කිරීම ඇතුලත් කර ඇති බවත්,එහෙත් මාර්ගයේ ආරම්භය සංවර්ධනය නොකර සපු කන්ද මාර්ගය සංවර්ධනය කිරීම කොතෙක් දුරට සාර්ථක ද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.අයි.සමන් කුමාර මැතිතුමා**

කොට්ඨාශයේ සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධව යෝජනා කිරීම සම්බන්ධව ස්තූතිය ප්‍රකාශ කළ අතර සභාපතිතුමා විසින් 2025 වර්ෂයේ සෝදාපාළුවට ලක් වූ කැඩී බිඳී ගිය මාර්ග පිළිබඳව තොරතුරු ලබා දෙන ලෙස අපට දන්වා තිබූ අතර ඒ පිළිබඳව අපි තොරතුරු ලබාදී තිබෙන බවත්,විශේෂයෙන් මෙම මාර්ගය කැඩී යාමට හේතුව ලෙස

01.ඉහළ වෙල්යායේ වතුර ඉවත්ව යන ඇළ මාර්ගය වසා ඇති බවත්, වර්ෂාව පවතින විට එම වෙල්යායේ වතුර මෙම මාර්ගය හරහා ගලායන බවත්,

02.අධික බර යෙදූ කොට ලොරි මෙම මාර්ගයේ ගමන් කිරීමත් විශේෂයෙන්ම මල්ලිකා මැතිනියගේ පාර්ශවිකයෙකු කොට ලොරි ගෙන යන බැවින් ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස එතුමියට ඉල්ලීමක් කරන බවත්,අයවැය යෝජනාව විවාදයට ගන්නා අවස්ථාවේ සභාගර්භයෙන් ඉවත් ගොස් 2026 අයවැය යෝජනා අතරට එම ව්‍යාපෘතිය ඉදිරිපත් කළ බව ප්‍රකාශ කිරීම කොතරම් සාධාරණද යන්න ප්‍රශ්න කරන ලදී.තවද මෙම මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව සභාපතිතුමාව අපිව දැනුවත් කර ඇති බවත්,ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ඉන්දික කුමාර මැතිතුමා ප්‍රකාශ කළ ඔබතුමියගේ පාර්ශවිකයෙකු දැව ප්‍රවාහනය කරනවා යන්නට විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නා ලෙසත්,මාර්ග ඕනෑම පුද්ගලයෙකුට භාවිතා කිරීමට සකසා ඇති බවත්,සභාවක් විදිහට භේද ඇති නොකර ගෙන මහජනතාවගේ සුබ සිද්ධිය උදෙසා කළ හැකි දෙයක් තිබේ නම් ඒ ඉටු කරමු යැයි ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.ජී.මල්ලිකා මැතිතුමිය**

සහෝදර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා මගේ පාර්ශවිකයකු කොට ඇදලා තමයි පාර කැඩිලා තියෙන්නේ කියලා නමුත් ඔබටවත් මටවත් පුද්ගලයෙකුගේ ජීවනෝපාය ලෙස කරන ව්‍යාපාර කටයුත්තක් වැළැක්විය නොහැකි බවත්, ඔහු විසින් මාර්ගය කැඩෙන විට ගල් යොදා පාර සකස් කළ බවත්, සභාවට දන්වා සිටිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රඹුක්කන ආසනයේ ජීවත්වන මහජනතාවගේ සුබ සිද්ධිය උදෙසා කටයුතු කිරීමට අප බැඳී සිටින බවත්,ඉන්දික මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි එසේ සභාවක කතා කිරීම සුදුසු නොවන බවත්,මහජනතාවගේ දැනුවත් වීම සඳහා මාර්ගය ආරම්භයේ මාර්ගය භාවිතා කළ හැකි බර සීමාව සඳහන් පුවරුවක් සවිකිරීම් සුදුසු බවත්,එසේ නොකර මෙසේ චෝදනා කිරීම සුදුසු නොමැති බවත්, විපක්ෂ මන්ත්‍රීවරු හැටියට මෙවැනි ප්‍රකාශ කිරීම සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මේ ලෝකයේ ජීවත් වන ඕනෑම පුද්ගලයකු කිසියම් දේශපාලන පක්ෂයක පාර්ශවිකයකු බවත්,මෙවැනි ප්‍රකාශ ඉදිරිපත් කිරීම ඡන්දදායකයින්ට කරන අගෞරවයක් බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වෛරී දේශපාලනයෙන් මිදී සැවොම එක්ව මෙම ගමන යාමට බැරි ඇයි දැයි විමසූ අතර සෑම පුද්ගලයෙකුගේම ගරුත්වය ආරක්ෂා වන පරිදි සභාවේදී හැසිරිය යුතු බවත්,විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ යෝජනාත් ක්‍රියාවට නැංවිය යුතු බවත්,වෛරයෙන් වෛරය නොසන් සිඳෙන බවත්, සැමට මෛත්‍රී වඩන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

අයවැය යෝජනාව වලදී රඹුක්කන ජනතාවගේ උන්නතිය උදෙසා යෝජනා ඉදිරිපත් කළ බවත්,විපක්ෂ මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලා එය විවාදයට නොගෙන සභාගාරයෙන් ඉවවත් ගිය බවත්,එය දේශපාලන වෛරය බවත් ප්‍රකාශ කරන ලදී.

සභා ගර්භය ඝෝෂාකාරී විය. සභාපතිතුමා විසින් සමථයකට පත් කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රජාතන්ත්‍රවාදි ලෙස මෙම මාස හය පුරාවටම සභාව මෙහෙයවූ බවත්,වෛරි දේශපාලනය සම්බන්ධව හොඳම උදාහරණය අද දින දුටු බවත්, ඕනෑම යෝජනාවක් සම්බන්ධව අදහස් දැක්වීමට සැමටම හැකියාව පවතින බවත්, දන්නා සිටි අතර එතුමිය විසින් ඉදිරිපත් කළ යෝජනාව භාරගන්නා බවත්, ක්‍රියාවට නැංවිය හැකි හොඳම ආකාරයෙන් එය ඉටු කර දෙන බවත් තහවුරටත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මෙම මාර්ගයේ වලවල් වලට බොරළු පස් දමා සංවර්ධනය කිරීමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දිසානායක මැතිතුමා**

i. රඹුක්න සතිපොළ භූමියේ දැනට පවතින කඩ කාමර වල සංඛ්‍යාව සහ හිමිකරුවන්ගේ නාම ලේඛනය යාවත්කාලීන කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දිසානායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

රඹුක්කන සතිපොළ භූමිය සභාව යටතට ගැනීමට සහා සම්මතයක් ගෙන තිබෙන අතර නමුත් වෙළඳාම් කිරීමට පැමිණෙන වෙළෙන්දන්ගේ හරි නාම ලේඛනයක් නොමැති බවත්, කාලයෙන් කාලයට එය වෙනස් වන බවත්, එහෙයින් සත්‍ය ආදායම ගණනය කිරීම අපහසු බවත් ප්‍රකාශ කරන ලද. තවද මෙම යෝජනාවට තව අදහසක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය බවත්,ඒ අනුව ස්ථිර ලෙස වෙළඳාම් කරන වෙළඳ ප්‍රජාව විශේෂ කාලසීමාවන් වලදී පමණක් වෙළඳාම් කිරීමට පැමිණෙන වෙළෙන්දන් නිසා ඔවුන්ගේ ආදායම අඩු වීම සම්බන්ධව මැසිවිලි නගන බවත්, සභාවක් විදිහට එයට විසඳුම් සෙවිය හැකිද යන්න පිළිබඳව සාකච්ඡා කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙම යෝජනාව ඉතා අගය කොට සලකන බවත්,පොළභූමියේ කඩ හිමියන් ආරක්ෂා කිරීම සඳහා ටෙන්ඩර් පටිපාටියක් පවතින බවත්,අනවසර ඉදිකිරීම් බහුලව පවතින බවත්, සභාවක් විදිහට මෙම ඉදිකිරීම් නාම ලේඛනයකට ගෙන සභාගත වුවහොත් ඔවුන්ට නීතිමය පැත්තකට යාමට ඇති හැකියාව වැඩි බවත් ප්‍රකාශ කරන ලදී.
රඹුක්කන කොට්ඨාශයේ වෙළඳ ප්‍රජාව ආරක්ෂා කිරීම සභාවක් විදිහට අපගේ වගකීම වන බවත්,මෙසේ දෛනිකව වෙළඳාම් කිරීමට පැමිණෙන වෙළෙන්දන්ගෙන් යම් ගාස්තුවක් අය කළ හැකි වන පරිදි සැලැස්මක් සකස් කිරීම් සුදුසු බවත්, මෙසේ ලේඛනගත කිරීම මගින් ඔවුන්ට අයිතියක් ලබාදීමක් සිදුවන බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සෑම සතියකම සඳුදා සහ බ්‍රහස්පතින්දා රඹුක්කන සතිපොළ පවතින බවත්.ස්ථිර වශයෙන් වෙළඳාම් කරන පුද්ගලයින් සිටින බවත්,ඔවුන්ගේ අනුදැනුම මත වෙනත් පුද්ගලයෙකු  එම ස්ථානයට යෙදවීම සිදුකළ හැකි බවත්,දසනායක මන්ත්‍රීතුමා අදහස් කරන පරිදි ඒ පිළිබඳ ලේඛනයක් පෙර පාලන කාලයන්හිදී පැවැති බවත්, රු 15,000.00 ක් පමණ ඔප්පු ගාස්තු ගෙවා එම කඩකාමර කොටස ලබාගත යුතු බවත්, ප්‍රකාශ කරන ලද. තවද වර්තමානයේ කෙසේ වෙළඳාම් වෙනවාද? යන්න නොදන්නා බවත්, කෙසේ වෙතත් ඒ පිළිබඳව සභාපතිවරයා දැනුවත් විය යුතු බවත්, බදු දිම සුදුසු නොවන බවත්, පිටස්තර වෙළඳ ප්‍රජාවට කඩකාමර බුක්ති විඳීමට ඉඩ ලබා නොදෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

රඹුක්කන බල ප්‍රදේශයේ වෙළඳ ප්‍රජාව වෙනත් බලප්‍රදේශ වලට වෙළඳාම් කටයුතු සිදුකිරීමට යන විට එම ඉඩකඩ ලබා ගැනීමට විශාල මුදලක් ගෙවිය යුතු බවත්,එසේම පිට පළාත්වල වෙළඳ ප්‍රජාව අප බල ප්‍රදේශයේ වෙළඳාම් කිරිමට පැමිණෙන විට අපගේ පොළභූමිය භාවිතා කිරීම සඳහා අපගේ වෙළඳ ප්‍රජාවගෙන් යම් මුදලක් අය කරන පරිද්දෙන්ම ඔවුන්ගෙන්ද යම් මුදලක් අය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලද.
අක්‍රියව පැවැති සතිපොළ සංගමය දැන් සක්‍රිය වී ඇති බවත්, සභාවක් වශයෙන් අපි මැදිහත් වෙලා හෝ වෙළඳ සංගමය මැදිහත් වෙලා හෝ මේ සම්බන්ධය යම් වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි සභාව භාරගන්නා විට ඔය කියපු ආක්‍රමිතා වංචා හා දූෂණ දුටු බවත්,ඒ සම්බන්ධ යම් වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බවත්,දේපළ සභාව සතු බැවින් එම යෝජනාව භාරගෙන ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමට තීරණය විය.

ii. අලි අනාථාගාරය අසල රථගාල ඉතා විදිමත් රථගාලක් ලෙස පවත්වාගෙන යාම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පින්නවල අලි අනාථාගාරය ඉදිරිපස තිබෙන රථගාල මේ වනවිට ඉදිවෙමින් පවතින බවත්,එය යම් ප්‍රමිතියකට අනුව ඇතුළු වීම පිටවීම සඳහා ක්‍රමානුකූලත්වයක් එනම් ගේට්ටු දෙකක් ස්ථාපිත කිරීම හා යම් කාඩ් පතක් ලබාදීම මගින් වංචා දූෂණ අවම වන බවත්,වර්ෂයක් වැනි කාලයක් තුළ ලැබෙන ආදායම් පිළිබඳව සත්‍ය තොරතුරු ලබා ගැනීමට හැකියාව එවිට ලැබෙන බවත් ප්‍රකාශ කරන ලද.තවද මාර්ගය දෙපස රඳවන වාහන පිළිබඳව වෙනත් විකල්පයකට යා යුතු නවත් ප්‍රකාශ කරන ලදී.

2026 වර්ෂයේ පුනරාවර්තන ආදායම රුපියල් මිලියන 224 ක් බවත් වැටුප් හා සභික දීමනා වෙනුවෙන් මිලියන 96 ක් එනම් සමස්ථ ආදායමෙන් 43.75% ක් ගෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.එම හේතුව නිසා පුනරාවර්තන ආදායම ඉහල නංවා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු බවත්, එසේ නොවුනහොත් රඹුක්කන සභාව නොබෝ වසර ගණනාවකින්ම අර්බුදයකට මුහුණ පාන බවත් ප්‍රකාශ කරන ලදී.

සභාවේ ගිණුම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව 2024 වර්ෂයේ සත්‍ය ආදායම 200 ක් හා වියදම් 100 ක් සංවර්ධන ව්‍යාපෘති නොමැති තත්වයකදී මෙසේ වුවද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන විට මෙම අගය ඉතා දුර්වල අගයක් බවත්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අප සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගත යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

විශේෂයෙන්ම සතිපොළ සභාව යටතේ මෙහෙයවීම මත රුපියල් මිලියන එකක ආදායමක් සභාවට ගත්තා සේම මෙමගින්ද සභාවේ ආදායමේ ඉහල නැංවීම ප්‍රමුඛ කාර්යක් බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙම ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සතුව පැවතුණු බවත්,අක්කර කාලක භූමි ප්‍රමාණයක් සභාව සතු බවත්, එම භූමි ප්‍රමාණය නිසි පරිදි තිබේද යන්න සොයා බැලිය යුතු බවත්, මාර්ගය දෙපස රථවාහන නැවතීම සම්බන්ධව යම් නීතිමය ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත්, සභාව සතු දේපළ නැවත සභාවට අත්පත් කරගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.තවද සභාව විසින් කොමිස් මුදලක් හෝ වැටුපක් ගෙවා එම ස්ථානයට පුද්ගලයකු යෙදවිය යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

මෙම යෝජනාවට අදහසක් ඉදිරිපත් කිරීමට කැමති බවත්,පෙර සභාපතිවරු මෙම සභාවේ මුදල් වලින් විශාල වැඩ කොටස් ප්‍රමාණයක් ආදායම් උත්පාදනය සඳහා සිදුකර ඇති බවත්,ඒ අනුව ප්‍රජා ශාලාව,මෙම ප්‍රදේශී සභා කාර්යාලය හා ආදාහනාගාරය දැක්විය හැකි බවත් ඔබතුමත්,එවැනි විශාල වැඩ කොටසක් මෙම උත්පාදනය කරගන්නා ආදායම් වලින් සිදු කරනු ඇතැයි විශ්වාස කරන බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඉතිහාසය ගැන කවුරු කවුරුත් දන්නා බවත්, එතුමා ඉදිරිපත් කළ යෝජනාවට සිදු කළ හැකි දේ පිළිබඳව සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මෙම යෝජනාව පිළිබඳ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට තීරණය කරන ලදි.

iii.රඹුක්කන ප්‍රදේශය අවට සංචාර ස්ථාන ඇතුළත් නාම පුවරුවක් නගරයේ සුදුසු ස්ථානයක ස්ථාපිත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.එම්.සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

රාත්‍රී කාලයේදී මහාමාර්ගයේ ගමන් කරන වාහන දුම්රියෙහි විදුලි ආලෝකය වැදීම මගින් බෙහෙවින් අපහසුතාවට පත්වන බවත්,ඒ නිසා මෙම හිස් අවකාශය ආවරණය කිරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට හැකියාවක් පවතී නම් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලීම් ලැබී ඇති බවත්, නගරය හුරු නැති පුද්ගලයින් රාත්‍රියේදී අනතුරුවලට ලක්වන බවත් ප්‍රකාශ කරන ලදී.මෙහිදී මා අදහස් කලේ දුම්රිය ආලෝකය පතිතවන ස්ථානය ආවරණය වන පරිදි රඹුක්කන සංචාරක පුවරයෙහි නැරඹිය හැකි ස්ථාන පිළිබඳව තොරතුරු ඇතුලත් කර වර්ග අඩි 10*20 ප්‍රමාණයේ වගේ පුවරුවක් සවිකිරීම සුදුසු බවත්, ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

කාලෝචිත යෝජනාවක් බවත්,එම නාම පුවරුව සකස් කිරීමට වැය බරක් දැරීමට සිදුවන නිසා එය පුද්ගලික ආයතනයකට ලබා දී එම පුවරුව දෙපැත්තම භාවිතයට ගත හැකි පරිදි මැදින් විදුලි ආලෝක බල්බයක්ද සවිකර සවිකිරීම සුදුසු බවත්,කරඬුපන හන්දියේ ද මෙවැනිම සංචාරක කලාපය පිළිබඳ විස්තර ඇතුළත් පුවරුවක් සවිකිරීමට හැකි නම් වඩාත් ආකර්ෂණයක් රඹුක්කනට ලැබෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

දසනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට සමාන යෝජනාවක් මීට කලින් මා ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන අතර මෙම සභාව පිහිටවූ දා සිට මා විසින් යෝජනා ගණනාවක් සභාවට ඉදිරිපත් කළ බවත්, එම යෝජනා සියල්ලටම සභා අනුමැතිය ලැබූ බවත්,නමුත් ඉන් එක යෝජනාවක් පමණක් ක්‍රියාත්මක වූ බවත්,එසේ වන්නේ මා විපක්ෂ මන්ත්‍රීවරයකු වීම ද යන්න ප්‍රශ්න කරන ලදී.තවද මා ඉදිරිපත් කළ යෝජනාත් මෙතුමාගේ යෝජනාවක් සේ සලකා හෝ ක්‍රියාත්මක කර රඹුක්කන ජනතාවට හිතකර නගරයන් නිර්මාණය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

2011 වර්ෂයේදී මහජන නියෝජිතයකු වශයෙන් සිටින කාලයේ මා ද මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළ බවත්,වහව හන්දිය, රඹුක්කන වටරවුම,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කරඬුපන හන්දිය වැනි ස්ථානවල රඹුක්කන පුරවරයේ සංචාරක ස්ථාන හා ඊට අදාළ දුර ප්‍රමාණයන්ද සඳහන් කර දැන්වීම් පුවරු සවිකිරීම ඉතා සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සංචාරක කර්මාන්තයට මෙය ඉතා හොඳ යෝජනාවක් බැවින් එක් ක්‍රියාවට නැංවීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරමු ලෙස ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමට සුදුසු ක්‍රියා මාර්ග ගැනිමට තීරණය විය.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

i.සභාවේ වැඩකටයුතු කර ගැනිමට යාමේදී අවශ්‍ය ලිපි කටයුතු සඳහා ලිපිද්‍රව්‍ය ලබා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ටී.එම්.ටී.බී.තෙන්නකෝන්** මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පැවති සියලුම පාලන කාලයන්හිදී මන්ත්‍රීවරු හට හිමි දීමනා ලිපි ද්‍රව්‍ය, පෑන්, අවශ්‍ය කරන සෑම දෙයක්ම ලබා ගැනීමට අපට හිමි වරප්‍රසාදයක් බවත්, විපක්ෂ මන්ත්‍රීවරු ලෙස අපට එම ලිපිද්‍රව්‍ය සඳහා යන වියදම දරා ගත නොහැකි බවත්, ඒ සඳහා සාධාරණ මුදලක් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පසුගිය සභාව අවස්ථාවලදී මෙම ලිපිද්‍රව්‍ය සපයා ගැනීමට අපට දීමනාවක් ලැබුණ බවත්, ලිපි ශීර්ෂ පමණක් ප්‍රමාණවත් නොවන බවත්, A4, පෑන් ,ලිපි ගොනු ආදීය අවශ්‍ය වන බවත්, පක්ෂ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය නැත්නම් විපක්ෂ මන්ත්‍රීවරුන්ට හරි රු 250.00 ක් රු 300.00 ක් හෝ රු 500.00 ක් ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කමිටුවක් පත්කර එම කමිටුව විසින් පරීක්ෂණයක් පවත්වලා ලිපිද්‍රව්‍ය සඳහා මන්ත්‍රීවරයෙකුට මසකට කොපමණ මුදලක් වැය වෙනවාද යන්න පිළිබඳව වාර්තාවක් සකස් කර ඒ අනුව සභාව විසින් තීරණයක් ගැනිම සුදුසු බව මා ප්‍රකාශ කරන නමුත් කමිටුවක් පත් කිරිමට සභිකයන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කළ නිසා මෙම මුදල නොගෙවන බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදි.

තීරණය -

මන්ත්‍රීවරුන් හට ලිපිද්‍රව්‍ය ලබා නොදීමට තීරණය කරන ලදි.

**(ඊ). II . කල් දී නොමැති යෝජනා**

### ඊ. II . 01.

ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 යටතේ කිරිවල්ලාපිටිය,අලවත්ත, පිළිකුඹුර සංවර්ධනය කිරීමේ කර්මාන්තය කිරිවල්ලා පිටිය ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

යෝජනාවේ සඳහන් සංවර්ධන කර්මාන්තය කිරිවල්ලාපිටිය ගොවිසංවිධානයට ලබාදීමට තීරණය විය.

### ඊ. II . 02.

දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන -2025 යටතේ හබ්බාව මාර්ගයේ චින්දිකා මහත්මියගේ නිවස අසල සිට ඉහළ ඇති පාලම දක්වා කොටස සංවර්ධනය කිරීම(රු 1000,000.00) හේනේපොල වසම හේනේපොල ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයට ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශයේ සභා මන්ත්‍රී වයි ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

තීරණය -

යෝජනාවේ සඳහන් සංවර්ධන  කර්මාන්තය හේනේපොල ජොෂ්ඨ පුරවැසි සංවිධානයට ලබාදීමට තීරණය විය.

### ඊ. II . 03.

පළාත් සභා කර්මාන්ත යටතේ අන්දිර මඩ  ඔවෙල මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තය හිරිවඩුන්න ප්‍රගති ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
යෝජනාවේ සඳහන් සංවර්ධන කර්මාන්තය හිරිවඩුන්න ප්‍රගති ගොවිසංවිධානයට ලබාදීමට තීරණය විය.

### ඊ. II . 04.

පළාත් සභා කර්මාන්ත 2025 යටතේ රන්දෙණිය සිට මොලගොඩ දක්වා මාර්ගයේ ආරම්භක ස්ථානයෙන් වමට යන මාර්ගය සංවර්ධනය කරමි.(LGR (RE) -2513705 ) හරංකහවත්ත නිවාස සංකීර්ණය -ග්‍රාම සංවර්ධන සමිතියට(කුඹල්ඔළුව වසම ) ලබාදිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
යෝජනාවේ සඳහන් සංවර්ධන කර්මාන්තය හරංකහවත්ත නිවාස සංකීර්ණය -ග්‍රාම සංවර්ධන සමිතියට ලබාදීමට තීරණය විය.

### ඊ. II . 05.

2024 පළාත් සභා අරමුදල් යටතේ ඉටුකළ රඹුක්කන කොම්පොස්ට් අංගනයේ ජල ටැංකිය ඉදිකිරිමට sws – 2413701 අදාළ රු742,703.81 ක මුදලක් සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු742,703.81 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීමට තීරණය විය.

### ඊ. II . 06.

සත්තව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රතිපාදන මත 2025 වර්ෂයේදී ඉදිකළ රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලයේ රැඳවුම් බැම්ම හා වැට අලුත්වැඩියා කිරිමට අදාළ මුදල ලෙස රු1,931,855.96 ක මුදල සී/ස රඹුක්කන වි.සේ.ස.සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු1,931,855.96 ක මුදල සී/ස රඹුක්කන වි.සේ.ස.සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

**ඊ. II . 07.**
ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025 යටතේ දැලිවල හන්දියේ සිට ගොඩගම්පල හරහා පදවිගම්පල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘයේ දැලිවල සමාධි වැඩිහිටි සමිතියට (මිලියන 02)ලබාදිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ ව්‍යාපෘතිය සංවර්ධනය කිරිම සඳහා මිලියන 02 ක මුදල දැලිවල සමාධි වැඩිහිටි සමිතිය ලබාදිමට තීරණය විය.

**ඊ. II . 08.**
ග්‍රාමීය මාර්ග සංවර්ධනය 2025 යටතේ වැ තැන්න කපුකන්ද දක්වා මාර්ගයේ බුදු පිළිමය අසල කොටස සංවර්ධනය කිරිම උඩගලදෙණිය වලගම්බා ගොවි සංවිධානයට .(මිලියන 01) ලබාදිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ ව්‍යාපෘතිය සංවර්ධනය කිරිම සඳහා මිලියන 01 ක මුදල උඩගලදෙණිය වලගම්බා ගොවි සංවිධානයට ලබාදිමට තීරණය විය.

**ඊ. II . 09.**
පළාත් සභා කර්මාන්ත 2025 යටතේ අඹුවන්ගල වැව දක්වා මාර්ගය සංවර්ධනය කිරිම -රු1,600,000.00 (LGR - 2513701) ව්‍යාපෘතිය අඹුවන්ගල ගොවි සමිතියට ලබාදිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ ව්‍යාපෘතිය සංවර්ධනය කිරිම සඳහා රු1,600,000.00 ක මුදල අඹුවන්ගල ගොවි සමිතියට ලබාදිමට තීරණය විය.

**ඊ. II . 10.**
රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා පුවත්පත් දැන්වීමක් ජාතික පුවත්පත වන දිණමිණ පුවත්පතෙහි පල කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා පුවත්පත් ජාතික පුවත්පත වන දිණමිණ පුවත්පතෙහි පල කිරිමට තීරණය විය.

**ඊ. II . 11.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල හා දෙල්දෙණිය ශ්‍රී සිවලි පෙර පාසලේ දරුවන්ගේ විසිරි යාමේ උත්සවය සඳහා ත්‍යාග ලබාදිම හා පෙර පාසලේ උත්සවය පැවැත්වීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනිම  සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රඹුක්කන ප්‍රාදේශීය සභා පෙර පාසල හා දෙල්දෙණිය ශ්‍රී සිවලි පෙර පාසල සඳහා විසිරි යාමේ උත්සවය පැවැත්වීම, ත්‍යාග ලබාදිම අනුමත කිරිම තීරණය විය.

**ඊ. II . 12.**

කොන්ගස්ගොඩැල්ල,ගල්පොල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරිමේ (ශාන්ති මියගේ නිවස අසල) රු1,900,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම  සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු1,900,000.00 ක් වටිනාකමින් යුත් ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**ඊ. II . 13.**

ආදොලුව මාර්ගයේ පැවති ගිලිගිය බෝක්කුව වෙනුවට නව බෝක්කු බටයක් සවි කිරිමේ රු 431,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු 431,000.00 ක් වටිනාකමින් යුත් ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**ඊ. II . 14.**

මෙම සභාවේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරි තනතුරේ සේවයේ යෙදී සිටින විශ්‍රාමික කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ කොන්ත්‍රාත් පදිනම මත සේවයේ යොදවා ගැනිමේ කාල සිමාව 2025.12.01 දිනෙන් අවසන් වන  බැවින් එදින සිට වසරක් එම කාල සීමාව දිර්ඝ කර ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව  ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික නිලධාරීන්ගේ හිගයක් පවතින බැවින් මේ සම්බන්ධව විරුද්ධත්වයක් පවතී ද යන්න විමසූ අතර විරෝධතාවයක් නොමැති බැවින් අනුමත විය.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
විශ්‍රාමික කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඞී.කලුආරච්චි මහතාගේ සේවයේ යොදවා ගැනිමේ කාල සිමාව 2025.12.02 දින සිට වසරක් සඳහා එම කාල සීමාව දිර්ඝ කිරිම අනුමත කිරිමට තීරණය විය.

### ඊ. II . 15.
සභා කර්මාන්ත යටතේ බැද්දවල වත්ත මාර්ගයේ කඩාගිය ස්ථානය සඳහා වන රු1,780,000.00 වටිනා ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු1,780,000.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

### ඊ. II . 16.
පොදු අරමුදල් 2025 යටතේ හිනාබෝව පල්ලේපොල මාර්ගය ආපදාවට ලක් වු කොටස සංවර්ධනය කිරිම රු500,000.00 සඳහා අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
හිනාබෝව පල්ලේපොල මාර්ගය ආපදාවට ලක් වු කොටස සංවර්ධනය කිරිම රු500,000.00 ක් අනුමත කිරිම තීරණය විය.

### ඊ. II . 17.
පොදු අරමුදල් 2025 යටතේ අඹතැන්න හිනාබෝව මාර්ගය වෙලමැද කැඩිගිය ස්ථානයට බෝක්කු බට යොදා සංවර්ධනය කිරිම රු250,000.00 ක් සඳහා අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අඹතැන්න හිනාබෝව මාර්ගය වෙලමැද කැඩිගිය ස්ථානයට බෝක්කු බට යොදා සංවර්ධනය කිරිම රු250,000.00 ක් අනුමත කිරිම තීරණය විය.

### ඊ. II . 18.
රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු Rw -2126 අංක දරණ ගලි බවුසර් ට්‍රැක්ටර් ටේලරය සම්පුර්ණයෙන්ම අලුත්වැඩියා කර ධාවනයට එක් කර ගැනිම සඳහා එම ටේලරයේ නිෂ්පාදිත හා අලෙවි ආයතනය වෙත යොමු කර මිල ඇස්තමේන්තුවක්

ලබා ගැනිමට අවශ්‍ය මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සැ.යු - රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් අතර මේ සම්බන්ධව අලුත්වැඩියා කරන්නේකු නොමැති අතර බල ප්‍රදේශය තුළද සුදුසුකම් ලත් අයෙක් නොමැත.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
Rw -2126 අංක දරණ ගලි බවුසර් ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියා කර ගැනිම සඳහා එම ටේලරයේ නිෂ්පාදිත හා අලෙවි ආයතනය වෙතින් මිල ඇස්තමේන්තුවක් ලබා ගැනිම තීරණය විය.

### ඊ. II . 19.

හදිසි ආපදා තත්වය හේතුවෙන් කිරිවන්දෙණිය වෙල මැද මාර්ගය කැඩි ඇති ස්ථාන සකස් කිරිම සඳහා සකස් කළ රු60,125.00 වටිනා ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු60,125.00 ක් වටිනා ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

### ඊ. II . 20.

රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදි කිරිම කර්මාන්තයේ 04 වන බිල් වටිනාකම වන රු29,296,721.82 ක මුදල කොන්ත්‍රාත්කරු වන SDS කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු29,296,721.82 ක මුදල SDS කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීම අනුමත කිරිම තීරණය විය.

### ඊ. II . 21.

පොළ භූමිය සකස් කිරිම සම්බන්ධ රු 14,256,000.00 ක් වටිනාකමක් ඇති ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පොළ භූමිය සම්බන්ධ සකස් කළ අතර එය රු 14,256,000.00 ක් වටිනාකමක් ඇති ඇස්තමේන්තුව බවත්,වෙළඳ ප්‍රජාවගේ දායකත්වයත් ලබාගෙන එය මඳක් හෝ කරගෙන යාමට කටයුතු කරමු යන්න පවසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.ඒ.පියරත්න මැතිතුමා**

මිලියන 14 ක් යනු විශාල මුදලක් බවත්, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව දැනට පොල භූමියේ සිටින වෙළෙන්දන්ට දීමේ හැකියාවක් නොමැති බැවින් මෙය ක්‍රියාවට නැංවීම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව නැවත සධ්‍යතා අධ්‍යනයක් සිදු කර මහ සභාවට නැවත ඉදිරිපත් කිරිම සුදුසු බැවින් ඉවත් කර ගන්නා ලදී.

**(උ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරිම.**

01.2025.10.15 දින පවත්වන ලදි කාර්මික කාරක සභා වාර්තාව පිළිගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

2025. 10.15 දින පැවැත්වූ කාර්මික කාරක සභාව වාර්තාවයි. එදින ගත් තීරණ අනුව

**පළමු යෝජනාව**

රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ZA 0191 දරන බැකෝ ලෝඩරයේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු අලුත් වැඩියා කටයුතු අනුමැතියට ඉදිරිපත් කරමි.

තීරණය

වෙනත් ආයතන දෙකකින් මිල ගණන් කැඳවා සහා අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු බව තීරණය විය.

දෙවැනි යෝජනාව

රඹුක්කන මහා සභාව පටිගත කරන රෙකෝඩරය අක්‍රීයව ඇත.එම රෙකෝඩරය අලුත් වැඩියාව සඳහා එක් ආයතනයක් පමණක් ඇති බවත් මින් පෙරද එම ආයතනය මගින් අලුත්වැඩියා කටයුතු සිදු කළ බවත්,සයුර මල්ටි ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයෙන් මෙම සේවාව කරගැනීමට කාර්මික කාරක සභා කමිටු අනුමැතියට ඉදිරිපත් කරමි.

තීරණය

අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට නිර්දේශය ලබාදීම කාර්මික කාරක සභාව තීරණය කරන ලදී.

තුන්වෙනි යෝජනාව

වරිපනම් අංශය මගින් K පෝරම් මුද්‍රණය කරන මුද්‍රණ යන්ත්‍රය අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එය සේවා කර ගතයුතු බවත්,මීට පෙර එම සේවා කරණය සිදුකර ඇත්තේ යුනිවර්සල් ඔපිස් ඔටෝමේෂන් ආයතනයෙන් බවත්, නමුත් මෙවර සේවාව සැපයීම සඳහා අප සභාවේ ලියාපදිංචි වී නොමැත. සුවිශේෂී යන්ත්‍රයක් බැවිනුත් මෙම සේවාව සිදුකිරීමට ඔවුන් හට හැකියාවක් පවතින බැවිනුත් එම ස්ථානයෙන්ම මෙම සේවාකරණය ලබා ගැනීමට කාර්මික කාරක සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

තීරණය

අලුත් වැඩියා කටයුතු සිදකිරීමට ආයතන වලින් මිල ගණන් කැඳවිය යුතු බවට කාර්මික කාරක සභාව තීරණය කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.10.15 දින පවත්වන ලද කාර්මික කාරක සභා වාර්තාව සඳහා කිසිදු විරෝධතාවයක් නොමැති බැවින් සභා සම්මත වූ බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

කාර්මික කාරක සභාව කමිටුව විසින් ගත් තීරණ අනුව ක්‍රියා කිරිමට තීරණය විය.

02. 2025.10.03, 2025.10.15, 2025.10.22, 2025.11.03 දින පැවත්වන ලදි මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභා වාර්තා පිළිගැනිමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජානව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ත්‍රී රෝද රථයේ තෙල් ගැසිමේදී ලීටර් 4 ක් සඳහා රු125,050.00 ක මුදලක් වියදම් කර ඇති බවත්, එම වටිනාකම නිවැරදි දැයි විමසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එය මුද්‍රණ දෝෂයක් බවත්,නියමිත වටිනාකම රු12,505.00 ක් බවත් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.10.03, 2025.10.15, 2025.10.22, 2025.11.03 දින පැවත්වූ මුදල් හා ප්‍රතිපත්ති සැකසිමේ කාරක සභා වාර්තා පිළිගැනිම සුදුසු බවට තීරණය විය.

**(ඌ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.**

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,452,523.28 | 1,863,248.38 | 1,658,783.05 | 71,050.53 | 491,467.99 | 8,537,073.23 |
| 02 ගමන් වියදම් | 21,208.44 | 3,600.00 | 350.00 | - | - | 25,158.44 |
| 03 සැපයුම් හා උපකරණ | 92,097.00 | 288,535.00 | 28,179.50 | - | 51,850.00 | 460,661.50 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 91,203.54 | 645,837.90 | 30,000.00 | 1,250.00 | 500.00 | 768,791.44 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 201,536.20 | 51,136.50 | - | 94,332.51 | 9,060.93 | 356,066.14 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 456,055.32 | 6,958.98 | 85,038.33 | - | 100,000.00 | 648,052.63 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 14,104.20 | | - | 52,020.00 | | 66,124.20 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **5,328,727.98** | **2,859,316.76** | **1,802,350.88** | **218,653.04** | **652,878.92** | **10,861,927.58** |
| 09 ප්‍රාග්ධන වැය | - | | | - | - | - |
| 10 ණය ආපසු ගෙවීම් | - | | | - | - | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **-** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | **5,328,727.98** | **2,859,316.76** | **1,802,350.88** | **218,653.04** | **652,878.92** | **10,861,927.58** |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | - | | | | | - |
| ලංකා බැංකුව | - | | | | | - |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 220,012.68 | | | | | 220,012.68 |
| විවිධ ණය හිමියෝ | - | | | | | - |
| ගබඩා ණය හිමියෝ | 960,556.50 | | | | | 960,556.50 |
| අත්තිකාරම් | 24,427.01 | | | | | 24,427.01 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | 74,000,000.00 | | | | | 74,000,000.00 |
| වෙනත් ගෙවීම් | 35,000.00 | | | | | 35,000.00 |
| **මුළු එකතුව** | **80,568,724.17** | **2,859,316.76** | **1,802,350.88** | **218,653.04** | **652,878.92** | **86,101,923.77** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 677,955.90 | 151,600.00 | - | - | 5,000.00 | 834,555.90 |
| 20 කුලී | - | 14,589.58 | 247,180.00 | 928,406.00 | 28,541.45 | 1,218,717.03 |
| 30 බලපත්‍ර සේවා | 52,524.00 | 275,000.00 | 5,030.00 | - | - | 332,554.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 26,673.76 | 372,096.60 | 175,757.04 | - | 2,130.00 | 576,657.40 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | 1,744,007.00 | - | - | 4,860.00 | 5,295.00 | 1,754,162.00 |
| 60 වෙනත් ආදායම් | 17,626,474.95 | 38,210.00 | 30,400.00 | - | 1,400.00 | 17,696,484.95 |
| 70 වෙනත් ආදායම් | 3,540,737.18 | 1,343,931.41 | 1,277,024.80 | 47,706.40 | 390,270.88 | 6,599,670.67 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **23,668,372.79** | **2,195,427.59** | **1,735,391.84** | **980,972.40** | **432,637.33** | **29,012,801.95** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව** | **23,668,372.79** | **2,195,427.59** | **1,735,391.84** | **980,972.40** | **432,637.33** | **29,012,801.95** |
| සේවක ණය | | | | | | - |
| මහජන බැංකුව - සේවක ණය | 130,350.00 | | | | | 130,350.00 |
| ලංකා බැංකුව - සේවක ණය | - | | | | | - |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 1,054,219.50 | | | | | 1,054,219.50 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ශීර්ෂ ආදායම | 76,719.51 | | | | | 76,719.51 |
| අත්තිකාරම් | 122,661.03 | | | | | 122,661.03 |
| ආයෝජන ආපසු ලැබීම් | 75,684,444.64 | | | | | 75,684,444.64 |
| වෙනත් ලැබීම් | 159,870.86 | | | | | 159,870.86 |
| **මුළු එකතුව** | **100,896,638.33** | **2,195,427.59** | **1,735,391.84** | **980,972.40** | **432,637.33** | **106,241,067.49** |

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 3.45 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.